# <u>මානව හිමිකම් පිළිවෙත්</u>
# <u>ශ්‍රී ලංකාව-2006</u>

ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ කම්කරු කාර්යාංශය විසින් නිකුත් කරන ලදී.
2007 මාර්තු 06

මිලියන 20 ක් පමණ වන ජනගහනයෙන් සමන්විත බහු පාක්ෂික ජන රජයක් වන ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයේ ජනාධිපතිවරයා මහින්ද රාජපක්ෂ මහතායි. 2005 නොවැම්බර් 17 වැනිදා ඔහු තේරීපත්ව ඇත. පාර්ලිමේන්තුව නියෝජිතයන් 225 දෙනෙකුගෙන් සමන්විතය. එය පාලන බලයට පත්වූයේ 2004 අප්‍රේල් මසය. පාර්ලිමේන්තුවේ සහ විධායක ජනාධිපතිවරයාගේ පාලන කාලය වසර හයකි. උතුරු නැගෙනහිර බොහෝ දෙමළ පුරවැසියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙස ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය නොහොත් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් කරන ලද බලපෑම හැරුණු විට 2005 ජනාධිපතිවරණය නිදහස් හා සාධාරණ එකක් බව යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ ඒකකයට අනුව පෙනීයයි. 17 වසරක සන්නද්ධ ගැටුම අවසන් කිරීමේ අරමුණ ඇතිව රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සටන් විරාම ගිවිසුමක් ඇතිකරගන්නා ලදී. පසුගිය වසර තුළදී එම ගිවිසුම බරපතල ලෙස නිරන්තරව උල්ලංඝනය වුවත්, එම ගිවිසුම නාමමාත්‍ර ලෙස බලාත්මක වේ. උතුරු යාපනය අර්ධද්වීපයේ සහ නැගෙනහිර පළාත ආශ්‍රිතව හමුදා මෙහෙයුම් රැසක් සිදුවිය.

සටන් විරාම ගිවිසුමේ බිඳ වැටීමත් සමග සිය පුරවැසියන්ගේ මානව හිමිකම් වෙත රජය විසින් දක්වනු ලබන සැලකිල්ලේ අඩුවක් දක්නට ඇත. රජයේ නියෝජිතයන් විසින් සිදුකළ නීතිවිරෝධී ඝාතන ඇතුළු මානව හිමිකම් උල්ලංඝණයන් ද, නාඳුනන පුද්ගලයන් විසින් සිදුකරන ඝාතනද, රජය සහ එල්.ටී.ටී.ඊ. ය විසින් දේශපාලන අරමුණු මත ඔවුන්ගේ අනුග්‍රහය ඇතිව අතුරු හමුදා කණ්ඩායම් විසින් කරන ලද ඝාතන හා අතුරුදන්වීම් ද විශ්වාසදායී මූලාශ්‍ර වෙතින් වාර්තා විය.

අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්, රඳවා ගැනීම්, අයහපත් බන්ධනාගාර තත්ත්වයන්, සාධාරණ නඩු විභාගවලට ඉඩ ප්‍රස්ථා අහිමිකිරීම්, රජයේ දූෂණය සහ එහි කටයුතුවල පාරදෘෂ්‍ය බවක් නොමැතිවීම, ආගමික නිදහස උල්ලංඝනය කිරීම, රැස්වීමේ නිදහස උල්ලංඝනය කිරීම සහ සුළු ජාතීන්ට එරෙහිව සිදුවන අකටයුතුකම් පිළිබඳවද මානව හිමිකම් නිරීක්ෂකයන් වාර්තා කර ඇත.

පුරවැසියන්ට එරෙහිව සිදුකළ සමහර සන්නද්ධ ප්‍රහාරවලට සම්බන්ධ වී ඇත්තේ, රජයේ ආරක්ෂක හමුදාවලට අනුබද්ධ අනු කණ්ඩ විසින් බවට වාර්තා රැසක් ලැබී තිබේ. දෙසැම්බර් මස 1 වැනිදා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඝාතනය කිරීමට දැරූ එල්.ටී.ටී.ඊ. උත්සාහයත් සමගම, රජය විසින් හදිසි නීතිය වඩාත් ශක්තිමත් කරන ලදී. සිවිල් වැසියන් වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගෙන මාස 12 ක කාලයක් දක්වා රඳවා තබාගැනීමට එමඟින් ආරක්ෂක හමුදාවට බලතල ලැබිණ.

එල්.ටී.ටී.ඊ.ය විසින් උතුරු හා නැගෙනහිර පළාත්වල විශාල ප්‍රමාණයක බලය අත්කරගෙන දේශපාලනය මූලික කරගත් මිනීමැරුම්වල යෙදී සිටියි. මරාගෙන මැරෙන ප්‍රහාර, අතුරුදන්වීම්, වධහිංසා, අත්තනෝමතික අත්අඩංගු හා රැඳවීම්, රැඳවියනට සාධාරණ ප්‍රසිද්ධ නඩු තීන්දු අහිමි කිරීම, පෞද්ගලිකත්වය කෙරෙහි වූ අවහිරතා, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සහ ප්‍රකාශණයට, මාධ්‍යයට හා රැස්වීමේ නිදහසට බාධා පැමිණවීම ඔවුන් විසින් කරනු ලබයි.

## මානව හිමිකම් සුරැකීම

## 1 කොටස

## පුද්ගල ඒකාග්‍රතාවයට ගරු කිරීම

### a. අත්තනෝමතික හෝ නීතිවිරෝධීව ජීවිත තුරන් කිරීම.

රජය විසින් දේශපාලන අරමුණු මත ඝාතන සිදුකරන බව තහවුරු කරන වාර්තා නොමැති වුවත්, පොලිසිය විසින් සිදුකරනු ලබන ඝාතනවල වර්ධනයක් ඇති බවට මානව හිමිකම් සංවිධාන හා වෙනත් විශ්වාසදායී මූලාශ්‍ර වාර්තා කර ඇත. එම මූලාශ්‍ර තවදුරටත් චෝදනා කර ඇත්තේ, අතුරු හමුදා කණ්ඩායම් විසින් ඇතැම් අවස්ථාවල රජයේ ආරක්ෂක හමුදා සහාය ඇතිව සිවිල් වැසියන් සහ ප්‍රතිවාදී දේශපාලන මත දරන්නන් ඉලක්ක කර ඝාතන සිදුකරන බවය. මෙම චෝදනා රජය සහ ආරක්ෂක හමුදා විසින් ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකා නාවික හමුදාව සහ එස්.ටී.එෆ්. විශේෂ කාර්ය බලකායේ දැඩි පාලනයට නතුව ඇති ත්‍රිකුණාමල වෙරළාශ්‍රිත අධි ආරක්ෂක කලාපයේ දෙමළ තරුණයන් 5 දෙනෙකු වෙඩි තබා ඝාතනය කර තිබුණේ, ඉකුත් ජනවාරි මාසයේදීය. සිවිල් කණ්ඩායම් සහ රජයේ නියෝජිතයින් හා සිවිල් වැසියන් විසින් මෙම ඝාතන විශේෂ කාර්ය බලකායේ හෝ පොලිසියේ ක්‍රියා බවට සැකකළත්, මෙම ඝාතන සිදුවී ඇත්තේ, විශේෂ කාර්ය බලකායට ලබාදී ඇති ගිනි අවිවලින් නොවන බවට රස පරීක්ෂක වාර්තාවක දැක්වුණු අතර, ඊට අදාළ පරීක්ෂණ ද පසුව ඒ අනුව අත්හැර දැමුණි. එනමුත් මෙම ඝාතන එස්.ටී.එෆ්. සඳහා නිකුත් කළ, ප්‍රමිතියෙන් තොර ගිනි අවි වලින් විශේෂ කාර්ය බලකාය විසින් සිදුකළ බව ඇතැම් විශ්වාසදායී නිරීක්ෂකයන්ගේ අදහස විය.

මැයි මස දෙවැනි දින අර්ධ හමුදා සාමාජිකයන් උතුරු පළාතේ යාපනයේ උදයන් දෙමළ පුවත්පත් කාර්යාලයට කඩා වැදී එහි අලෙවි සහ බෙදාහැරීමේ කළමනාකරු බී.ජී. සහෝදාස්, රාත්‍රී අධීක්ෂක ආර්. රංජිත් යන දෙදෙනා මරා දැමූහ.

ඔක්තෝබර් මස 30 වැනි දින නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර දෙමළ එක්සත් සන්ධාන පළාත් පාලන නියෝජිත ගෝපාල ක්‍රිෂ්ණන් පද්මනාදන්ව නාඳුනන සන්නද්ධ පිරිසක් විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබ ඇත.

නොවැම්බර් මස 10 වැනි දින කොළඹ ප්‍රධාන මාර්ගයකදී දෙමළ සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් වෙඩි තබා ඝාතනය කළේ, අතුරු හමුදාවනට අනුබද්ධ ඝාතකයන් පිරිසක් විසින්ය. (දෙමළ ජාතික සන්ධානය එල්.ටී.ටී.ඊ.යේ දේශපාලන අරමුණුවලට සහාය පළකරයි.)

පසුගිය මැයි මාසයේදී උතුරේ කයිට්ස් දූපතේ සිවිල් වැසියන් රැසක් ඝාතනය කෙරිණි. මීට ශ්‍රී ලංකා නාවික හමුදාවට චෝදනා එල්ල විය. නිදසුනක් වශයෙන් සෙල්ලදුරේ අමලදාස්ගේ නිවසට ඇතුළු වූ පිරිසක් විසින් 8 දෙනෙකු ඝාතනය කෙරිණ. තවත් තුවාලකරුවෙක් පසුව රෝහලේ දී මියගියේය. ආපන ශාලාවක හිමිකරුවෙකු, ඔහුගේ පවුලේ සාමාජිකයන් දෙදෙනෙකු සහ වයෝවෘද්ධ පුද්ගලයෙකු ද ඝාතනය කෙරිණි. හියුමන් රයිට්ස් වොච් (HRW) සංවිධානයට අනුව සිද්ධිය පිළිබඳව රජය මගින් පොලිස් පරීක්ෂණ ආරම්භ කර තිබුණි. මෙම සිවිල් ඝාතන ගැන සෙවීමට රජය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු (රහස් පොලිසියේ) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එම්. මහේෂ් පෙරේරාගේ නායකත්වයෙන් කණ්ඩායමක් පත්කර තිබුණි. මෙම කණ්ඩායම යාපනයට ගොස් සිද්ධියෙන් දිවි ගලවාගත් පුද්ගලයන්ගේ ප්‍රකාශ සටහන් කර ගත් අතර, දිවි ගලවාගත් එකම පුද්ගලයා මහේස්ත්‍රාත්වරයා හමුවේ

ප්‍රකාශ කළේ, සිය සැමියාට සහ සහෝදරයාට නාවික හමුදා භටයන් වෙඩි තැබූ බවයි. එනමුත් එම භටයන් හඳුනාගැනීමට ඇය අපොහොසත් වූවාය. යාපනය මහේස්ත්‍රාත්වරයා හඳුනාගැනීමේ පෙරට්ටුවක් පවත්වන ලෙස නියෝග කළ නමුත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු පොලිස් කණ්ඩායම විසින් කිසිදු පියවරක් ඒ සම්බන්ධයෙන් අනුගමනය කළේ නැත. වසර අවසානය වන තෙක් සිද්ධියේ විභාගය අවසන් වී නොතිබිණ.

ජූනි මස 17 වැනිදා මන්නාරම පේසාලේ ප්‍රදේශයේ ක්‍රිස්තියානි දේවස්ථානයකට නිල ඇඳුමින් සැරසුනු පිරිසක් විසින් වෙඩි තබා ඇති අතර එම හේතුවෙන් සිය ගණනක් දෙමළ වැසියන් සරණාගතයන් බවට පත්වූහ. එම සිද්ධියෙන් එක් පුද්ගලයකු මරුමුවට පත්ව පස්දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් තුවාල ලබා ඇත. බලධාරීන් ප්‍රකාශ කළේ, වසර අවසානය වන විටත්, මේ සම්බන්ධ පරීක්ෂණවල කිසිදු ප්‍රගතියක් සිදුවී නැති බවය.

අගෝස්තු මස 10 වැනි දින ත්‍රිකුණාමල ප්‍රදේශයේ එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශ වෙත හමුදාව විසින් ගුවනින් බෝම්බ හෙලීම හේතුවෙන් සිවිල් වැසියන් 50 දෙනෙකු මරුමුවට පත්ව 200 ක් තුවාල ලබා ඇත. අගෝස්තු 14 වැනි දින හමුදාව විසින් බෝම්බ 12-16 දක්වා සංඛ්‍යාවක් මුලතිව් ප්‍රදේශයට හෙලූ අතර එමගින් තරුණියන් 51 දෙනෙකු මරුමුවට පත්ව ඇත. සිය ගණනකට අධික සංඛ්‍යාවක් තුවාල ලබා ඇත. කිසිදු පරීක්ෂණයක් මීට අදාළව ආරම්භ වී නොමැත.

අගෝස්තු මස 17 වැනි දින ප්‍රංශ රාජ්‍ය නොවන සංවිධානයක් වන ඇක්ෂන් කොන්ට්‍රෙ ලාෆේම් (ACF) සංවිධානයට අනුබද්ධ දේශීය සේවකයන් 17 දෙනෙකු, (ද්‍රවිඩ ජාතිකයින් 16 දෙනෙකු හා එක් මුස්ලිම් ජාතිකයෙකු) වෙඩි තබා ඝාතනය කෙරුණු අතර, එය මුතූර් අවට ප්‍රදේශයේ සිදුවී ඇත. ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව (SLMM) නිගමනය කළේ, මෙම ඝාතන සඳහා ආරක්ෂක හමුදාව වගකිව යුතු බවයි. එහෙත්, රජය එම චෝදනා ප්‍රතික්ෂේප කළේය. රජය විසින් ඔස්ට්‍රේලියානු පරීක්ෂකයන් මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට කැඳවූ අතර ඒ සඳහා වූ එකඟතා සැප්තැම්බර් මාසයේදී ඇතිකර ගැනිණි. වසර අවසානය වන විටත් පොලිසිය විසින් ඊට අදාළව කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොතිබිණි.

වසර තුළදී නාඳුනන පුද්ගලයන් විසින් සිදුකරන ලද ඉහළ මට්ටමේ ඝාතන රැසක් සම්බන්ධයෙන් අනාවරණයන් සිදුවිය. උදාහරණයක් වශයෙන් අප්‍රේල් මස 7 වැනි දින නාඳුනන තුවක්කුකරුවන් විසින් දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරාපේක්ෂක වී. විග්නේෂ්වරන් නාවික හමුදා මුරපොළකදී ඝාතන කෙරිය. පොලිසිය මේ සම්බන්ධයෙන් වසර අවසානය වන තෙක් කිසිවෙකු අත්අඩංගුවට ගෙන තිබුනේ නැත.

අප්‍රේල් මස 26 වැනි දින මඩකලපුවට ආසන්න ප්‍රදේශයක තිබී ගෙල සිඳ මරා දමන ලද ද්‍රවිඩ ජාතික ගොවියන් පස්දෙනෙකුගේ සිරුරු ප්‍රදේශවාසීන් විසින් සොයාගෙන තිබුණි. මැයි මස 13 වැනි දින යාපනය අර්ධද්වීපයේ නාවික හමුදා පාලනයට අයත් කයිට්ස් දූපතේ ද්‍රවිඩ ජාතිකයන් 13 දෙනෙකුගේ පවුලක් ඔවුන්ගේ නිවසේදී ඝාතනය කෙරුණේ නාඳුනන ඝාතකයන් පිරිසක් විසිනි.

2004 නොවැම්බර් මස ඝාතනය කෙරුණු ජෙරාඩ් පෙරේරාගේ මරණය සම්බන්ධයෙන් පොල්වත්ත රටබඳුගේ අජිත් විශ්වනාථ් නැමති සැකකරුවෙක් පොලිසිය විසින් පෙබරවාරි 5 වැනි දින අත්අඩංගුවට ගෙන ඇත. නිලධාරීන් විසින් ජෙරාඩ් පෙරේරාට වධහිංසා සිදුකර තිබුනේ 2002 දී ඔහු පොලිස් අත්අඩංගුවට පත්ව සිටි අවධියේදී වන අතර ඔහු 2004 නොවැම්බර් මාසයේදී වෙඩි තබා ඝාතනය කෙරිණි. ඔහු මරා දමනු ලැබුවේ පොලිසිය තුළදී ඔහු ලද අත්දැකීම් පිළිබඳව පොලිසිය හා මානව හිමිකම් නිරීක්ෂකයින්ට කරන ලද පැමිණිලිවලින් පසුවය. 2002 දී ජෙරාඩ් පෙරේරාට වධහිංසා සිදුකිරීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් 7 දෙනෙකු අතුරින් තිදෙනකු ඔවුන් පෙරේරා මරා දැමූ බව පිළිගත් අතර, එසේ

කිරීමට හේතුවූයේ ඔවුන්ට එරෙහි නඩු විභාගයේදී සාක්ෂි දීමෙන් පසු සිර දඬුවම් විඳීමට සිදුවනු ඇතැයි යන බියෙන් බව පැවසිණ. වසර අවසානය වන විට අත්අඩංගුවේ සිටියදී නිලධාරීන් 6 දෙනෙකු මෙම කුමන්ත්‍රණය සිදුකර ඇත. 2002 දී ජෙරාඩ් පෙරේරාට වධහිංසා සිදුකිරීම සම්බන්ධයෙන් හා ඔහුගේ මරණය 2004 දී සිදුකිරීම සම්බන්ධයෙන් මීගමුව මහාධිකරණය හමුවේ නඩු දෙකක් විභාග වෙමින් පවතී. නඩු විභාගය වසර අවසානය වන විටත් අවසන් වී නොතිබුනු අතර අගවිනිසුරුවරයා විසින් නියෝග කර තිබුනේ නඩු විභාගය සිදුකරන විනිසුරුවරයා එම නඩුවෙන් ඉවත්කරන ලෙසටයි.

මාර්තු මස 25 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේදී පානදුර පොලිසියේ නිලධාරීන් දෙදෙනකු නල්ලවරිගේ සඳසිරි ප්‍රනාන්දු නැමැත්තාට පහර දී සිහි විසඥ තත්ත්වයට පත්කර තිබුනේ අදාළ පුද්ගලයාගේ සොහොයුරා අත්අඩංගුවට ගැනීමට ප්‍රයත්න දැරූ අවස්ථාවේදීයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මාර්තු 28 වැනිදා ප්‍රනාන්දු ප්‍රාදේශීය රෝහලකදී ජීවිතක්ෂයට පත්විය. බලධාරීන් පොලිස් නිලධාරීන් දෙදෙනකු නම්කලත් වසර අවසානය වන තෙක් ඔවුන් තවදුරටත් සේවයේ රැඳී සිටිනු දකින්නට තිබුණි. මෙම කරුණට අදාළව කිසිවෙකු අත්අඩංගුවට ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට වසර අවසානය වන තෙක් කිසිවෙකු පියවර ගෙන නොතිබුණි.

අප්‍රේල් මස 10 වැනි දින කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම පොලිසිය විසින් දොන් විජේරත්න මුණසිංහ නැමති ත්‍රිරෝද රථ රියදුරෙකු එම රථය නැවැත්වීම ප්‍රතික්ෂේප කිරීම නිසා එම රථයෙන් තල්ලුකර දමා තිබුණි. මෙම නිලධාරීන් එම පුද්ගලයාට පහර දී තිබුනේ ඔහුගේ බිරිඳ සහ පුතා ඉදිරිපිටය. ඉන් අනතුරුව ඔහු පොලිස් අත්අඩංගුවේදී ද පහරකෑමට ලක්විය. අප්‍රේල් මස 11 වැනි දින මුණසිංහ නිදහස් කෙරුණු අතර ඔහු අනතුරුව අප්‍රේල් මස 16 වැනි දින ජීවිතක්ෂයට පත්වූයේ පොලිස් නිලධාරීන්ගේ පහරකෑම්වලට ලක්ව සිදුවූ තුවාල හේතුවෙනි. වසර අවසානය වන විට සිද්ධිය නීතිපති දෙපාර්තමේන්තුවට වැඩිදුර විභාගය සඳහා යොමුකර තිබුණත්, අදාළ පහරදීම් සිදුකළ පොලිස් නිලධාරීන් තිදෙනා තවදුරටත් සේවයේ නිරතව සිටින බව වාර්තා විය. මීට අදාළව පොලිසිය විසින් කිසිවෙකුත් අත්අඩංගුවට ගෙන නොතිබුණි.

ප්‍රභූ මට්ටමේ දේශපාලන ප්‍රතිවාදීන් හා සිවිල් වැසියන් ඉලක්ක කරගනිමින් මහා පරිමාණ ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වසර තුළදී එල්.ටී.ටී.ඊ.යට චෝදනා නැගී ඇත. අප්‍රේල් මස 17 වැනි දින යුද හමුදා මූලස්ථානයට එල්ල වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා බරපතල තුවාල ලැබූ අතර එම සිද්ධියෙන් තවත් පුද්ගලයන් 8 දෙනෙකු මියගොස් ඇත. (1g කොටස බලන්න.) ජූනි මාසයේදී එල්.ටී.ටී.ඊ. සංවිධානයට අයත් මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු විසින් කොළඹට ආසන්නයේ යුද හමුදා මූලස්ථානයේ තෙවැනි ප්‍රධානියා වන ජෙනරාල් කුලතුංග ඝාතනය කරන ලදී. අගෝස්තු මස 13 වැනි දින සාම ක්‍රියාවලිය සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ලේකම් කේදිස්වරන් ලෝගනාදන් වෙඩි තබා ඝාතනය කෙරුවේ එල්.ටී.ටී.ඊ. තුවක්කුකරුවන් බවට අනුමාන කෙරේ. ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී විමුක්ති පෙරමුණේ (EPRLF) සංවිධානයේ හිටපු සාමාජිකයකු වන ලෝගනාදන් කොළඹ පිහිටි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ගැටුම් විශ්ලේෂක අධ්‍යක්ෂවරයා වශයෙන් සේවය කර ඇත.

අගෝස්තු 14 වැනි දින පකිස්තානු මහ කොමසාරිස්වරයා සිය ආරක්ෂකයින් සමග ගමන් කරමින් සිටියදී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් ජීවිතය ගලවාගෙන ඇති බව හියුමන් රයිට්ස් වොච් (HRW) නිකුත් කළ වාර්තාවකට අනුව දැක්වෙයි. එම සිද්ධියෙන් පුද්ගලයන් 7 දෙනෙකු මියගොස් ඇත.

සැප්තැම්බර් 17 වැනි දින ආරුගම්බේ ආසන්නයේ පොතුවිල්හිදී ඉදිකිරීම් සේවකයන් 10 දෙනෙකු වූ මුස්ලිම් ජාතිකයින්ගේ කැපුම් තුවාල සහිත සිරුරු බලධාරීන් විසින් සොයාගෙන තිබුණි. දිවි ගලවාගත් අයෙකුගේ සාක්ෂි අනුව මෙම ඝාතන එල්.ටී.ටී.ඊ.ය විසින් සිදුකර ඇත. මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ

පැවැත්වීමට දෙසැම්බර් මාසයේදී ජනාධිපති විමර්ශන කොමිසමක් පත්කෙරිණි. එම කොමිසමට මෙම සිද්ධිය සහ තවත් සිදුවීම් රැසක් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට බලය පැවරී ඇත.

නොවැම්බර් 24 වැනි දින ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට අවශ්‍යව සිටි සහෝදරයන් දෙදෙනෙකු භාරවීමෙන් පසු ඔවුන් පොලිස් අත්අඩංගුවට ගෙන දින දෙකක අත්අඩංගුවේ සිටියදී මරාදමා තිබුණි. පොලිස් නිලධාරීන් මෙම ඝාතනයේ වගකීම භාරගෙන තිබුනේ ඔවුන් ආත්මාරක්ෂාව පිණිස එය සිදුකළ බවට හේතුදක්වමිනි. වසර අවසානය වන විටත්, මීට අදාළව පරීක්ෂණයක් පැවැත්වීම ආරම්භ වී තිබුණේ නැත.

බෙල්ලනවිතානගේ සනත් යසරත්න 2004 දී වෙඩි තබා ඝාතනය කිරීම, 2004 දී අත්අඩංගුවේදී මුතුතන්ත්‍රීගේ චමල් රංජිත් කුරේ ඝාතනය කිරීම හෝ 2004 ඔක්තෝබර් මාසයේදී පොලිසිය විසින් හර්මන් ක්වින්ටස් පෙරේරා ඝාතනය කිරීම සම්බන්ධ චෝදනා පිළිබඳ කිසිදු ප්‍රගතියක් මේ වන තෙක් වාර්තා වී නැත. පෙරේරාගේ පවුලේ උදවිය සඳහා වන්දි ගෙවීමක් ද සිදුවී නොමැති අතර ඊට අදාළ නඩු විභාගය තවමත් පවතී.

මඩකලපුව අම්පාර දිස්ත්‍රික්කය භාර එල්.ටී.ටී.ඊ. සංවිධානයේ දේශපාලන අංශ නායක ඊ. කෞශල්‍යයන් 2005 දී ඝාතනය කිරීම සහ දෙමළ ජාතික සන්ධානයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජී.සී. නේරු ඝාතනය කිරීම සම්බන්ධ පරීක්ෂණවල කිසිදු ප්‍රගතියක් මේ වන තෙක් වාර්තා වී නැත. එල්.ටී.ටී.ඊ. සංවිධානය මේ පිළිබඳව චෝදනා කළේ, හමුදා බුද්ධි ඒකක සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් කැඩී ඉවත්වුනු කරුණා පාර්ශ්වය ඇතුළු සෙසු හමුදා අනු බන්ඩ විසින් මෙම ඝාතන සිදුකළ බවයි.

දෙමළ ඊළාම් ජනතා විමුක්ති සංවිධානයේ (PLOTE) හිටපු ක්‍රියාකාරිකයෙකු වූ ආරුමුගම් ශ්‍රී ස්කන්ධරාජා නොහොත් පීටර් පොලිසිය විසින් අත්අඩංගුවට ගැනුනේ දෙමළ මාධ්‍යවේදී සිවරාම් ධර්මරත්නම් 2005 අප්‍රේල් මාසයේදී ඝාතනය කිරීමට අදාළවයි. දැනට ඔහු නඩු විභාගයකට මුහුණ දී සිටින අතර ශ්‍රී ස්කන්ධරාජා ඇප මත මුදාහැරීමට අධිකරණය නියෝග කර ඇත. මඩකලපුව ආරක්ෂක හමුදා පුළුල් බලසීමාවකට නතුවූ ප්‍රදේශයකදී මධ්‍යම රාත්‍රි දේව මෙහෙයකදී 2005 දෙසැම්බර් මාසයේදී ද්‍රවිඩ සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝෂප් පරරාජසිංහම් නාඳුනන තුවක්කුකරුවන් පිරිසක් විසින් ඝාතනය කෙරුණි. එල්.ටී.ටී.ඊ. සංවිධානය චෝදනා කළේ, රජයේ ආරක්ෂක හමුදා ඔවුන් සමග සිටින හමුදා අනු බන්ඩ සමග කුමන්ත්‍රණය කිරීමෙන් පසු මෙම ඝාතනය සිදුකළ බවයි. අප්‍රේල් මස 24 වැනි දින රජය විසින් ජනාධිපති පරීක්ෂණ කොමිසමක් මේ පිළිබඳව සොයා බැලීමට පත්කෙරිණි. මෙම ඝාතනයට අදාළව සැකකරුවන් දෙදෙනකු ජූලි මාසයේදී පොලිසිය විසින් අත්අඩංගුවට ගත් අතර වසර අවසානය වන විටත් ඔවුන්ට එරෙහිව අධිකරණය හමුවේ අධිචෝදනා ඉදිරිපත් කර නොතිබුණි.

සිවිල් ජනතාව තුවාල කිරීමට හා ඔවුන් මරණයට පත්කිරීමට හේතු වන බිම්බෝම්බ අනතුරු තවදුරටත් සිදුවෙමින් පවතී. (1g කොටස බලන්න)

## b. අතුරුදන්කිරීම්

රජය විසින් හෝ එහි අනු බන්ඩ හමුදා විසින් හෝ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිදුකරන ලද දේශපාලන අරමුණු මත සිදුවූ අතුරුදන්වීම් 345 ක් පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වාර්තා පළකර තිබුණි. (1g කොටස බලන්න)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වාර්තාවට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 33 දෙනෙකු නාඳුනන පුද්ගලයන් විසින් පැහැරගෙන ඩොලර් 23,251 ක් (රුපියල් 2,526,221)

සිට ඩොලර් 558,035 (රුපියල් 60,630,502) දක්වා කප්පම් මුදල් අයකරගෙන ඇත. මෙසේ පැහැරගත් 12 දෙනෙකු කප්පම් මුදල් ගෙවීමෙන් පසුවද නිදහස් කර නොමැත. මෙම පැහැරගැනීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට හිටපු මහාධිකරණ විනිසුරු මහානාම තිලකරත්නගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පත්කරනු ලැබුවත් වසර අවසානය වන තෙක් කිසිදු වාර්තාවක් එමඟින් නිකුත් නොවුණි.

ජාත්‍යන්තර ක්ෂමා ආයතනයට අනුව (AI) මැයි 6 දින යාපනය දිස්ත්‍රික්කයේ චාවකච්චේරි නගරයට වයඹ දෙසින් පිහිටි මන්තුවිල් හින්දු දේවස්ථානය සරසමින් සිටි දෙමළ ජාතිකයන් 8 දෙනෙකු අතුරුදන්වී ඇති අතර එම අවස්ථාව වන විට ආරක්ෂක හමුදා හින්දු දේවස්ථානයේ රැඳී සිට ඇත. වසර අවසානය වන විටත්, මෙම 8 දෙනා සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් වාර්තාවී නොතිබුණි.

කයිට්ස් දූපතේ අල්ලප්පිඩ්හි ශාන්ත මරියා දේවස්ථානයේ වෙන්සස්ලෝස් වින්සස් විමලදාස් සහ තිරුචෙල්වම් නිහාල් ජිම් බ්‍රවුන් නැමති පූජකවරුන් අගෝස්තු මස 20 වැනි දින නාඳුනන පුද්ගලයන් දෙදෙනකු විසින් පැහැරගනු ලැබුණි. ශ්‍රී ලංකා නාවික හමුදාව අල්ලප්පිඩ් ප්‍රදේශයේ පාලනය භාරව සිටී. මෙම පැහැර ගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදා සෙබලුන්ගේ සහභාගීත්වය පිළිබඳව සැක පහළ කෙරෙනුයේ ජාත්‍යන්තර ක්ෂමා ආයතන වාර්තාවකට අනුවයි.

මඩකලපුව නගරයේදී සෞන්දර්ය සහ සංස්කෘතික අංශයේ පීඨාධිපති බාලසිංහම් සුගුමාර් නාඳුනන පුද්ගලයින් දෙදෙනකු විසින් සැප්තැම්බර් 29 වැනිදා පැහැරගෙන ගොස් ඇත. සුගුමාර් බැලීමට ඊට පෙර පැමිණි මෙම පිරිස් ඔහුගේ පවුලට මේ සම්බන්ධයෙන් කිසිවෙකුටත් පැමිණිලි නොකරන ලෙස තර්ජනය කර තිබුණු බවට ජාත්‍යන්තර ක්ෂමා ආයතන වාර්තා සඳහන් කරයි. මෙම පැහැරගැනීම සිදුවී ඇත්තේ, රජයේ පාලන ප්‍රදේශයකය. නිරීක්ෂකයන් සැකකරනුයේ මේ සඳහා ආරක්ෂක හමුදා සහභාගීත්වයක් ඇති බවයි. පීඨාධිපති සුගුමාර් මුදාහැරීම සඳහා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය රවින්ද්‍රනාත් සිය ධුරයෙන් ඉල්ලා අස්විය යුතු බව පැහැරගත් පුද්ගලයන්ගේ ඉල්ලීම වී තිබුණි. සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් කිරීමෙන් පසු සුගුමාර් නිදහස් කෙරිණ. ඉන්පසු, මහාචාර්ය රවින්ද්‍රනාත් කොළඹ ප්‍රදේශයට පදිංචියට ගිය අතර, කොළඹ අධි ආරක්ෂිත කලාපයේ සමුළුවකට සහභාගිවන අතරතුරේදී දෙසැම්බර් 15 වැනිදා ඔහු අතුරුදන්විය. වසර අවසානය වන විටත්, ඔහු මුදාහැර නැත.

බලහත්කාරයෙන් හා බලපෑම් මත සිදුකෙරෙන අතුරුදන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරී කමිටුව 2000 දී උපුටා දැක්වූ අතුරුදන්වීම් පිළිබඳ පරීක්ෂණවල කිසිදු ප්‍රගතියක් මේ වන තෙක් ඉදිරිපත්වී නැත. එපමණක් නොව මෙම සිදුවීම් සම්බන්ධයෙන් 2000 වසරේ සිට තොරතුරු එක්රැස් කිරීමට හෝ ඒ ගැන සෙවීමට රජයේ පාර්ශ්වයෙන් කිසිදු ප්‍රයත්නයක් දරා නොමැත. එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුව විසින් ඉහත වසරේදී පුද්ගල අතුරුදන්වීම් 12 ක් වාර්තා කර තිබුණි. ඒවායින් 7 ක් සම්බන්ධයෙන් තවමත් පරීක්ෂණ අවසන් වී නොමැත.

1996-97 කාලය තුළ යාපනය ප්‍රදේශයේ සිදුවූ අතුරුදන්වීම් ගැන පරීක්ෂණ පවත්වන රජයේ කොමිසම විසින් ලිපි මගින් තහවුරු කලේ රජයේ හමුදා මගින් අත්අඩංගුවට ගැනීමෙන් පසු එම පුද්ගලයින් අතුරුදහන් වූ බවයි. එම පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් විසින් මෙම ලිපි හබයාස් කෝපුස් නඩු සඳහා ඉදිරිපත් කර ඇත. වසර අවසානය වන විට එක් නඩුවක විනිශ්චය අවසන් වී නැත.

ආරක්ෂක හමුදා විසින් සිදුකරන ලද අතුරුදන්වීම් 16,305 ක් පිළිබඳව මානව හිමිකම් කොමිසම විසින් සිදුකරන පරීක්ෂණ වසර අවසානය වන විට පැවැත්වෙමින් තිබිණ. මෙම සමහර අතුරුදන්වීම් දශකයකටත් ඉහත කාලයක දී සිදුවී ඇත. එවැනි අතීත අතුරුදන්වීම්

සිදුවීම්වලට එරෙහිව ආරක්ෂක හමුදා පුද්ගලයන්ට එරෙහිව පරීක්ෂණ නඩු පැවරීම් හෝ අධි චෝදනා පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි.

කප්පම් සඳහා සිවිල් වැසියන් රඳවා ගැනීම එල්.ටී.ටී.ඊ.ය විසින් දිගින් දිගටම කරගෙන යන බව වසර තුළදී වාර්තා විය. (1g කොටස බලන්න) ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව SLMM වාර්තා කළේ, මෙම වසර තුළදී එල්.ටී.ටී.ඊ. සහ කරුණා පාර්ශ්වයන් විසින් සිදුකරන ලද පැහැරගැනීම් ඉහළ මට්ටමක පැවති බවයි.

## c. වධහිංසා හා අමානුෂික හෝ අවමන් සහගත සැළකීම් හෝ දඬුවම්.

වධහිංසනයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ ඇතැම් වගන්ති ක්‍රියාත්මක නොවුනත් වධහිංසනය දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත්කර ඇත. වධහිංසනය තහනම් වුවත්, සුවිශේෂී අවස්ථාවලදී සෙසු පුද්ගලයන් සඳහා එහි අනුමැතියක් ඇති බව මානව හිමිකම් සංවිධාන පෙන්වා දෙයි. මානව හිමිකම් කොමිසමේ වාර්තා සහ වෙනත් විශ්වසනීය මූලාශ්‍ර පෙන්වා දෙන්නේ, නොයෙකුත් පාපොච්චාරණ ලබාගැනීමට පොලිසිය විසින් වධහිංසා යොදා ගන්නා බවයි. තවද, වධහිංසා හෝ වෙන ඕනෑම තත්ත්වයන් යටතේදී පුද්ගලයෙකු විසින් කරන පාපොච්චාරණ ඔහුව නැවත උසාවියකට ඉදිරිපත් කරන තෙක් ප්‍රයෝජනයට ගැනීමට හදිසි නීති තත්ත්වයන් යටතේ ඉඩ සැලසේ. මෙම වසර තුළදී පුද්ගලයන් 528 ක් අත්අඩංගුවට ගෙන තිබුනේ හදිසි අවස්ථා රෙගුලාසි යටතේය. කෙසේ වුවද, ඉන් 288 දෙනෙක් පැය 12 ක් ඇතුළත නිදහස් කර ඇත. මෙසේ අත්අඩංගුවට පත්වූ බහුතරය ද්‍රවිඩ ජාතිකයන් වෙයි. එසේම රැඳවියන් අතර සිංහල සහ මුස්ලිම් ජාතිකයන් ද සිටී. ත්‍රස්තවාදය සම්බන්ධ සැකපිට පුද්ගලයන් රඳවාගනු ලබන අතර එසේ රඳවා තැබීමට හේතුවන්නේ ඔවුන් හඳුනා ගැනීමේ අපහසුතාවය, මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම හෝ වරෙන්තු මත සිටීම වැනිදේය. (1d කොටස බලන්න) නිරීක්ෂකයන්ගේ දත්තවලට අනුව පුද්ගලයන් 200 ක් රැඳවුම් නියෝග යටතේ වසර අවසානය වන විට රඳවනු ලැබ සිටිති. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් වාර්තා කළේ, වසර තුළදී පොලිස් අත්අඩංගුවේදී සිවිල් වැසියන් 433 දෙනෙකු වධහිංසනයට පාත්‍රව ඇති බවයි. (1c කොටස බලන්න)

වධහිංසන ක්‍රම යටතට පොලු, යකඩ පොලු, ජලනළ බට යනාදිය භාවිතයෙන් සිදුකරන පහරදීම්, විදුලි කම්පනයන් ඇතිකිරීම්, ශරීරයේ සංවේදී ස්ථානවල ක්‍රියාකාරීත්වය අත්හිටුවීම්, පිළිස්සීම්, ලිංගේන්ද්‍රියවල අපයෝජන සහ දියේ ගිල්වා තැබීම් යනාදිය ඇතුලත්ය. ඇතැම් රැඳවියන් තමන්ට සිදුවූ බරපතල තුවාල සහ කැඩුණු ඇටකටු යනාදිය ගැන ප්‍රතිකාර ලබන අවස්ථාවලදී පැමිණිලි කර ඇත.

2002 වසරේදී නන්දනී හේරත් නැමැත්තියව ලිංගික අපයෝජනයකට ලක්කිරීම හා ඇයව වධහිංසනයට ලක්කිරීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් තිදෙනෙකුට එරෙහිව කුරුණෑගල මහාධිකරණයේ ගොනුකර තිබූ අධිචෝදනා විභාගය 2005 ඔක්තෝබර් මාසයේදී ආරම්භ විය. වසර අවසානය වන විටත් නඩු විභාගය පැවැත්වෙමින් තිබිණි.

පොලිස් වධහිංසන පිළිබඳ වාර්තා 44 න් වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ, උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් පිට පොලිස් ස්ථානවලිනි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට අනුව ශ්‍රී ලංකා රජය විසින් වධහිංසනය පිළිබඳ සිදුවීම් කෙරෙහි පරීක්ෂණ තවදුරටත් පවත්වමින් සිටී. වසර අවසානය වනවිටත් මෙවැනි සිදුවීම් 14 කට අදාළ නඩු අධිකරණය හමුවේ විභාග වෙමින් පැවතුණි. ඒ වන විටත් කිසිවෙකු වරදකරු බවට තීරණය වී නොතිබුණි.

ආසියානු මානව හිමිකම් කොමිසම වාර්තා කළේ, අගෝස්තු 24 වැනිදා කැකිරාව පොලිස් ස්ථානයේදී සුද්දාගේ සිරිසේන නැමති ගොවියෙකු පොලිසිය අත්අඩංගුවට ගෙන වධහිංසනයට ලක්කර ඇති බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු ශාරීරිකව බරපතල තුවාල ලැබූ බවත් ඔහුගේ නාසය කැඩී දත් 5 ක් අහිමි වී සිටි බවත් එම වාර්තාවල දැක්වෙයි. මෙම

පුද්ගලයා පසුව දින කිහිපයකට රෝහල් ගත කර තිබුණි. වසර අවසානය වන විටත්, සිරිසේනගේ සිද්ධිය සම්බන්ධයෙක් කිසිදු පොලිස් නිලධාරියෙකුට එරෙහිව විනය පියවරක් ගෙන නොතිබුණු අතර, ඔහුට එරෙහිව නඩු පවරා තිබුනේ නැත.

2005 වසර තුළ පවරා තිබූ පොලිස් වධහිංසන නඩු අතුරින් හෙවන හෙන්නැදිගේ ප්‍රියදර්ශන ප්‍රනාන්දු සහ ජයසේකර විතානගේ සමන් ප්‍රියංකර සම්බන්ධ නඩු වසර අවසානය වන විටත් අවසන් වී නොතිබුණි. 2005 පොලිස් වධහිංසන නඩු අතුරින් පාලිත තිස්ස කුමාර පිළිබඳව විභාගයේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ, උප පොලිස් පරීක්ෂකවරයා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වධහිංසනය සම්බන්ධ 11 වෙනි ව්‍යවස්ථාව උල්ලංඝනය කර පීඩාවට පත්වූ පුද්ගලයා වධහිංසනයට ලක්කර ඇති බවයි. මේ සඳහා අදාළ පුද්ගලයා වෙනුවෙන් ඩොලර් 250 (රුපියල් 25,000) ක වන්දියක් ගෙවන ලෙස නියෝග කෙරිණි. උප පොලිස් පරීක්ෂකවරයා විසින් ශාරීරික තුවාල සිදුකිරීම පිළිබඳව වෛද්‍ය වාර්තාව අනුව ඔහුගේ ක්‍රියාකලාපය අනවශ්‍ය බලය උපයෝගී කිරීමක් වුවත්, පාලිත තිස්ස කුමාරට ප්‍රතිකාර කිරීම වධහිංසනය හේතුවෙන් සිදුවූවක් නොවන බවට මහාධිකරණ විනිසුරුවරයා නිගමනය කර තිබුණි.

වධහිංසනය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමුකිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් ස්ථාපිත කෙරිණි. ආරක්ෂක හමුදා සහ පොලිස් නිලධාරීන් 139 දෙනෙකුට එරෙහිව අධි චෝදනා පත්‍ර 218 ක් මෙම ඒකකය විසින් එම වසර තුළදී ඉදිරිපත් කෙරිණි. එම සංඛ්‍යාව අතුරින් අධි චෝදනා 65 ක නඩු විභාග අවසන් කෙරුණු අතර 30 ක් තවමත් විභාග වෙමින් පවතී. අන්තර් පාර්ලිමේන්තු ස්ථාවර තේරීම් කාරක සභාව සහ මානව හිමිකම් ප්‍රශ්න මත වූ අන්තර් අමාත්‍ය ක්‍රියාකාරී කමිටුව විසින් වධහිංසා වලට අදාළ වූ අපරාධ පරීක්ෂණවල දිගින් දිගටම නියැලී සිටී.

මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් චෝදනා ලත් පොලිස් නිලධාරීන්ට උසස්වීම් ලබාදීමට පොලිස්පතිවරයා ගෙන තිබූ පියවරට අදාළ චක්‍රලේඛය ඔක්තෝබර් මාසයේදී අභියාචනාධිකරණය විසින් අවලංගු කරන ලදී.

"ශූන්‍ය ඉවසීම" නැමති වධහිංසන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට 2004 වසරේදී මානව හිමිකම් කොමිසම විසින් පියවර ගෙන තිබුනේ එය තුළ පිහිටුවන ලද වධහිංසන වැළැක්වීමේ නිරීක්ෂණ ඒකකය තුළිනි. (4 වෙනි කොටස බලන්න) මානව හිමිකම් කොමිසම විසින් මෙම ඒකකයට අනුයුක්ත නිලධාරීන්ට අතිරේක පුහුණුවක් ලබාදී තිබූ අතර, වධහිංසනය සම්බන්ධ පැමිණිලි කෙරෙහි ක්ෂණික පරීක්ෂණ ආරම්භ කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව වසර අවසානය වන විට වධහිංසන පැමිණිලි 433 ක් සම්බන්ධයෙන් නඩු විභාග පවත්වාගෙන යාමට මානව හිමිකම් කමිටුවට හැකිවී ඇත.

බන්ධනාගාර සහ රැඳවුම් මධ්‍යස්ථාන තත්ත්ව

අඩු සනීපාරක්ෂක පහසුකම් සහ රැඳවියන්ගේ අතිරික්තය නිසා ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූල වීමට බන්ධනාගාර තත්ත්ව අපොහොසත් වී ඇත. ඇතැම් අවස්ථාවලදී වැඩිහිටි රැඳවියන් වෙතින් බාලවයස්කාර රැඳවියන් වෙන්ව තබා ගැනීමට පවා නොහැකි වී තිබේ. වරදකරුවන් වීමෙන් පසු සිර දඬුවම් විඳින සිරකරුවන්ගෙන් නඩු විභාගවලට මුහුණ දෙන රක්ෂිත බන්ධනාගාරගත කළ සිරකරුවන් වෙන්කිරීමට ද පියවර ගෙන නැත.

ජාත්‍යන්තර රතුකුරුස කමිටුවේ ICRC නිරීක්ෂකයන් ඇතුළු ස්වාධීන මානව හිමිකම් නිරීක්ෂකයන්ට රැඳවියන් පරීක්ෂා කර බැලීම සඳහා අවසර ලබාදීමට රජය පියවර ගෙන තිබුණි. රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පාලන ප්‍රදේශවල බන්ධනාගාර පහසුකම් හා රැඳවුම් මධ්‍යස්ථාන පිළිබඳ පරීක්ෂා කිරීම් 15 ක් සිදුකළ බවත් එම පරීක්ෂාවන් කිසිවකට කිසිදු බාධාවක් සිදුනොවූ බවත් වාර්තා විය. තහනම් නොවුනු අවස්ථා 15 ක් සිදුවී ඇති බව වාර්තා

වෙයි. නිරීක්ෂකයන් වාර්තා කළේ, බන්ධනාගාරවල තත්ත්වය දේශීය ප්‍රමිතිය සමග අනුකූල බවයි.

## d. අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම්

අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම් නීතියෙන් තහනම් කර ඇත. කෙසේ නමුත්, එවැනි දේ සිදුවී ඇත. පුද්ගලයන් 528 දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණු අතර, ඒවා හදිසි අවස්ථා රෙගුලාසි ක්‍රියාත්මකව පැවති අවධියේදී සිදුවී ඇත. රජය සඳහන් කළේ, අත්අඩංගුවට ගත් වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන දින කිහිපයකට පසු මුදාහල බවයි.

දෙසැම්බර් මස පළමුවැනි දින එල්.ටී.ටී.ඊ.ය විසින් සිදුකළ ආරක්ෂක ලේකම් ඝාතන ප්‍රයත්නයට ප්‍රතිචාර වශයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ඇතැම් කොටස් හදිසි අවස්ථා රෙගුලාසිවල අතිරේක අංග බවට ගෙන ක්‍රියාකිරීමට රජය පියවර ගෙන තිබුණි. මීට පෙර ආරක්ෂක හමුදාවලට ලබාදී තිබූ අත්අඩංගුවට ගැනීම් හා රැඳවුම් බලතල මෙම පියවර නිසා වඩාත් පුළුල් විය.

### පොලිස් සහ ආරක්ෂක හමුදා යාන්ත්‍රණයේ භූමිකාව

2005 නොවැම්බර් ජනාධිපතිවරණයෙන් පසු රජය විසින් 66,000 කින් සමන්විත පොලිස් බලකායේ පාලන බලයද, 6000 ක් වූ අතුරු හමුදා විශේෂ කාර්ය බලකායේ පාලන බලයද ආරක්ෂක අමාත්‍යංශය යටතට පත්කරන ලදී. අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යංශය අහෝසි කෙරිණ. පොලිසියට එරෙහි පැමිණිලි විභාග කිරීමට පොලිස් බලකායේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් පත්කර ඇති අතර ඒ හැර සිවිල් වැසියන්ගෙන් සමන්විත ජාතික පොලිස් කොමිසම මගින්ද ඒවා විභාග කෙරේ. එහි ද්‍රවිඩ නිලධාරීන් කිහිපදෙනෙකු සේවය කරන අතර, දෙමළ බහුතරයක් වෙසෙන ප්‍රදේශවල පොලිස් නිලධාරීන් සුළු පිරිසක් දෙමළ මාධ්‍යයෙන් ක්‍රියාකරන අතර සාමාන්‍ය වශයෙන් ඔවුන් දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව කථා නොකරති. විශේෂයෙන් පොලිස් වධහිංසනය හෝ සිවිල් වැසියන් අධි ආරක්ෂිත කළාපවලදී අතුරුදන් කිරීම් සම්බන්ධයෙන් පොලිස් නිලධාරීනට දඬුවම් නොලැබීම ප්‍රශ්නයක් වී ඇත. පොලිස් බලකාය තුළ පවතින දූෂණය බරපතල අර්බුදයක් නිර්මාණය කර ඇති බව ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන චෝදනා කරයි.

පොලිස්පතිවරයා හැරෙන්නට පොලිස් නිලධාරීන්ගේ උසස්වීම්, පත්කිරීම්, ස්ථානමාරුකිරීම විනය කටයුතු සහ සේවයෙන් පහකිරීම සම්බන්ධ කටයුතුවලට අදාළ බලය පැවරී ඇත්තේ, ජාතික පොලිස් කොමිසමටය. එය මුළුමනින්ම සිවිල් වැසියන්ගෙන් සමන්විතය. පොලිසියට එරෙහි මහජන පැමිණිලි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සහ ඊට අදාළ විධිවිධාන ස්ථාපිත කිරීමේ බලය ද පොලිස් කොමිසම සතුව ඇත. කෙසේ නමුත්, ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු නිලධාරීන් පිළිබඳ විනය කටයුතු ජාතික පොලිස් කොමිසම විසින් පොලිස් පරීක්ෂකවරුන් වෙත පවරා ඇත. 2005 නොවැම්බර් මාසය වන විට ජාතික පොලිස් කොමිසමේ තෙවසරක සේවා කාලය නිම විය. වසර අවසානය වන විටත්, රජය විසින් ජාතික පොලිස් කොමිසම සඳහා නව කොමසාරිස්වරුන් පත්කලේ නැත.

### අත්අඩංගුවට ගැනීම් සහ රැඳවුම්

සාමාන්‍ය නීති තත්ත්වය යටතේ පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේදී, එම අත්අඩංගුවට ගැනීමට හේතුව ඔහුට දැනුම්දීම සහ අත්අඩංගුවට ගෙන පැය 24 ක් තුළ මහේස්ත්‍රාත්වරයෙකු හමුවට ඉදිරිපත් කිරීම සිදුකළ යුතු වුවත්, සිදුවන්නේ, පුද්ගලයන් දින ගණනාවක් රඳවා තබා මහේස්ත්‍රාත්වරුන්ට ඉදිරිපත් කිරීමයි. අත්අඩංගුවට පත්

පුද්ගලයෙකුට ඇපදීම, ඇපදීමට අදාළත්වය හෝ ඇපදිය නොහැකි වැරදි සඳහා තවදුරටත් රඳවා තබාගැනීම සම්බන්ධ නියෝගයක් හෝ තෙමසක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වන රැඳවුම් නියෝගයක් දීමට මහේස්ත්‍රාත්වරයෙකුට බලය ඇත්තේය. මිනීමැරුම්, සොරකම්, මංකොල්ලකෑම් සහ ස්ත්‍රී දූෂණ සම්බන්ධ චෝදනාවලදී පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට පොලිසියට වරෙන්තු අවශ්‍ය නොවේ. මිනීමැරුම් සම්බන්ධ සිද්ධියකදී සැකකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීම මහේස්ත්‍රාත්වරයා විසින් අනිවාර්යයෙන් සිදුකළ යුත්තකි. එහිදී අදාළ සැකකරුට ඇප ලබාදිය හැක්කේ, මහාධිකරණය හමුවේ පමණි. සියලු අවස්ථාවලදී සැකකරුවන්ට නීතිඥ නියෝජනයක් ලබාගැනීමේ අයිතිවාසිකම් හිමිව ඇත. මහාධිකරණ සහ අභියාචනාධිකරණයේ විභාග වන අපරාධ නඩු සම්බන්ධයෙන් රජයේ නීතිඥ සහාය දිළිඳු විත්තිකරුවන්ට සැපයේ. එහෙත්, අනික් නඩුවලදී එසේ නොමැත.

2005 අගෝස්තු මාසයේදී විදේශ ඇමතිවරයා ඝාතනය කිරීමෙන් පසු පාර්ලිමේන්තුව විසින් හදිසි අවස්ථා රෙගුලාසි ස්ථාපිත කෙරිණි. එමගින් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම් හා සම්බන්ධ බලතල ආරක්ෂක හමුදාවට ලබාදී ඇත. පැය 24 ක් තුළ පොලිසියට එම සැකකරුවන් ඉදිරිපත් කළ යුතුවේ. සිවිල් වැසියන් හදිසි අවස්ථා රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගැනීමෙන් පසු වසරක දක්වා වූ කාලයක කිසිදු නඩු විභාගයකින් තොරව රඳවනු ලැබ සිටිති.

මානව හිමිකම් අපයෝජන සිද්ධීන්වලට සම්බන්ධ ආරක්ෂක හමුදා පිරිස් වගකිවයුතු යැයි හැඟුණ බොහෝ අවස්ථාවලදී රජය විසින් ඒ සඳහා වගකිවයුතු පුද්ගලයන් හඳුනා ගැනීමට හෝ ඔවුන් යුක්තිය හමුවට පැමිණවීමට පියවරගෙන නොමැත. වධහිංසනය සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමේදී අවුරුදු 7 ක අනිවාර්ය සිර දඬුවමක් පැණවීමට ඇති නීතිමය ඉඩකඩ නිසා ඇතැම් විනිශ්චයකාරවරුන් අදාළ සැකකරුවන් වරදකරුවන් කිරීමට පසුබට වන බව මානව හිමිකම් සංවිධාන විසින් සඳහන් කරයි. සාක්ෂිකරුවන් ආරක්ෂා කරගැනීමේ වැඩපිළිවෙළක් නොමැත. මානව හිමිකම් සංවිධානවලට අනුව වෛද්‍ය සාක්ෂි ලබාගැනීම දුෂ්කර ක්‍රියාවක් වන අතර ඊට හේතුව අධිකරණ වෛද්‍ය විශේෂඥවරුන් 25 දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටීමය. තවද වෛද්‍ය නිලධාරීන් නුපුහුණු තත්ත්වයෙන් සිටින අතර ඔවුන් වධහිංසනය සම්බන්ධ පරීක්ෂණ සිදුකිරීමට තරම් එම ක්ෂේත්‍රය ප්‍රගුණ කර නැත. සමහර සිදුවීම්වලදී වෛද්‍යවරුන්ගේ රාජකාරියට පොලිසියේ මැදිහත්වීම් සිදුවන අතර එම හේතුවෙන් වධහිංසනයට ලක්වූවන් සම්බන්ධයෙන් නිරවද්‍ය වෛද්‍ය වාර්තා ඉදිරිපත් වීම දුෂ්කර වී ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යොමුකරන ලද රැඳවුම් සම්බන්ධ නඩුවල නීත්‍යානුකූල තත්ත්වය හා පෞද්ගලිකව පුරවැසියන්ගෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව මානව හිමිකම් කොමිසම විසින් පරීක්ෂණ ආරම්භ කර ඇත.

## e. සාධාරණ නඩු විභාගයක් ප්‍රතික්ෂේප වීම.

ස්වාධීන අධිකරණ ව්‍යුහයක් නීතියෙන් ස්ථාපිත වී ඇති අතර රජය විසින් මෙම ස්වාධීනත්වය සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් සැලකීමක් කරයි.

අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ පත්වීම් ජනාධිපතිවරයා විසින් සිදුකරනු ලබයි. පහළ අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ පත්වීම් සහ ස්ථාන මාරුකිරීම් සිදුකරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසිනි. මෙම කොමිෂන් සභාව අගවිනිසුරුවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විතයි. පාර්ලිමේන්තුව සහ ජනාධිපතිවරයා විසින් ඒකාබද්ධව කරන පරීක්ෂණවලින් පසු විනිශ්චයකාරවරුන් විෂමාචාර හා අකර්මන්‍ය තත්ත්වයක සිටින අවස්ථාවකදී ඉවත් කිරීමට පියවර ගත හැක.

### <u>නඩු විභාග ක්‍රියා පිළිවෙත</u>

අපරාධ නඩු විභාග කිරීම මහජන ජූරි සභා මගින් ප්‍රසිද්ධියේ සිදුකෙරේ. විත්තිකරුවන්ට එරෙහිව ඇති චෝදනා සහ සාක්ෂි පිළිබඳ ඔවුන් දැනුවත් කෙරේ. එසේම එම නඩු විභාගවලට මුහුණ දීම සඳහා නීතිඥවරයෙකු පත්කර ගැනීමේ අයිතිය සහ අභියාචනයකට ඇති අයිතියද ඔවුනට පවතී. අභියාචනාධිකරණය සහ මහාධිකරණයේ අපරාධ නඩුවලට ලක්වන දිළිඳු විත්තිකරුවන්ට නීතිඥවරුන් ලබාදීමට රජය පියවර ගනී. එහෙත්, වෙනත් නඩුවලදී එවැනි නීතිඥවරුන් ලබාදීමට හැකියාවක් නොමැත. පෞද්ගලික නීති ආධාර සංවිධාන මගින් සමහර විත්තිකරුවන් සඳහා සහය ලබාදෙන අතර නීති ආධාර කොමිසම විසින් නීතිඥවරයෙකු සඳහා වියදම් දැරිය නොහැකි පුද්ගලයන් සඳහා නීති ආධාර ලබාදෙයි. කෙසේ නමුත්, සමහර මූලාශ්‍ර වාර්තා කරන්නේ, ඇතැම් නියෝජිතයන් ප්‍රතිලාභීන්ගෙන් මුදල් ගසාකෑම් සිදුකරන බවයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පැවරෙන නඩු සඳහා ජූරි විභාග නොපැවැත්වේ. විත්තිකරුවන් නිර්දෝෂී පුද්ගලයන් බවට පූර්ව නිගමනයක් පවතී. අපරාධ සඳහා පාපොච්චාරණ ලබාගැනීම වධහිංසන ඇතුළු විවිධ බලහත්කාරකම් සිදුවෙයි. එසේ බලහත්කාරයෙන් ලබාගන්නා පාපොච්චාරණ වලංගු වන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ගොනුකර ඇති නඩු හැර අනෙක් ඒවා වෙනුවෙන් පමණි. සිය පාපොච්චාරණ ලබාගන්නා ලද්දේ බලහත්කාරයෙන් බව පෙන්වීමට අවශ්‍ය සාක්ෂි විත්තිකරුවන් විසින් දැක්විය යුතුවේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ විත්තිකරුවන්ට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතියක් ඇත. ඇතැම් නඩුවලට අදාළ අධිකරණ ප්‍රතිශෝධනවලට යටත්ව සිය නඩුවට අදාළ විභාගය අවසන් වන තෙක් මාස 18 ක් දක්වා කාලයක් මෙම විත්තිකරුවන් බන්ධනාගාරවල රැඳවීමට පරිපාලනමය නියෝග නිකුත් වෙයි. කෙසේ නමුත් ඔවුන්ගේ නඩු විභාගය ඇරඹීමෙන් පසු එහි තීරණ කඩිනමින් පිරිනැමේ.

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් අණ පනත් සහ අධිකරණ නඩු විභාග පැවැත්විය යුතු බවට, නීතියේ සඳහන් වේ. නමුත්, යාපනය සහ උතුරු පළාතෙන් පිට අධිකරණවල නඩු කටයුතු ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් සිදුකෙරේ. අධිකරණය විසින් පත්කරනු ලබන භාෂා පරිවර්තකයන්ගේ හිඟය මීට හේතුවී ඇත. මේ හේතුවෙන් දෙමළ භාෂාව කථාකරන විත්තිකරුවන්ට සාධාරණ නඩු විභාගයක් සඳහා වන අවස්ථාව සීමා වී ඇත. උතුරු පළාතේ නඩු විභාග දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් සිදුවෙයි. දෙමළ භාෂාව කථාකරන විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත් උසාවිවල සිටින අතර, මහාධිකරණ විනිසුරුවරුන් සිව්දෙනෙක් ද, එක් අභියාචනාධිකරණ විනිශ්චයකරුවරයෙක්ද, එක් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාවරයෙක් ද දෙමළ භාෂාව ප්‍රගුණ කර ඇත. ඇතැම් නීති පාඨමාලා පොත් දෙමළ භාෂාවෙන් මුද්‍රිතය. සියලුම නීති පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ප්‍රකාශ කළ යුතු බව දැක්වෙන නීතියක් තවම රජය විසින් සම්මත කර නොමැත.

2004 අගෝස්තු මාසයේදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම (UNHRC) එළඹ තිබුනේ නල්ලරත්නම් සිංහරාසා සඳහා සාධාරණ නඩු විභාගයකට තිබූ අයිතිය උල්ලංඝනය වී ඇති බවයි. 1993 දී වධහිංසනයට පාත්‍රකොට සකස් කරන ලද අපරාධ පාපොච්චාරණයකට ඔහුගේ වම් මාපට ඇඟිලි සලකුණ බලහත්කාරයෙන් ලබාගැනුනේ එය ඔහුට කියවා දීමකින් තොරවය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම (UNHRC) විසින් ඔහු නිදහස් කරන ලෙස හෝ නැවත නඩු විභාගයක් පවත්වන ලෙස රජයට කරන ලද නිර්දේශවලට ප්‍රතිචාර දැක්වීමට රජයට දින 90 ක් ගතවිය. 2005 වසරේ පෙබරවාරි මස දැක්වූ රජයේ පිළිතුරෙහි සඳහන් වූයේ ඉහළ උසාවියකින් වරදකරු ලෙස තීන්දු කළ අයෙකු නිදහස් කිරීමට හෝ නඩුව නැවත විභාග කිරීමට නීතිය ඉඩ නොසලසන බවය. වසර අවසාන වන විටත් සිංගරාසා බන්ධනාගාරයේ රඳවා සිටි අතර ඔහුගේ නීතිඥ මඩුල්ල විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනුකරනු ලබන මූලික අයිතිවාසිකම් පෙත්සමකට අදාළ කටයුතුවල නිරතව සිටි බව වාර්තා විය. 2003 වසරේ ගොනුකරන ලද ටෝනි ප්‍රනාන්දු නඩුව සම්බන්ධයෙන් වසර අවසන් වී තිබියදීත් රජය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබිණි. 2005 මාර්තු මස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම (UNHRC) විසින් නිගමනය කළේ,

රජය විසින් ටෝනි ප්‍රනාන්දු සඳහා වන්දි ගෙවීමට ඉඩ සලස්වමින් නීති සම්පාදනය කළ යුතු බවයි.

විවාහ වීමේ වයස, දික්කසාදය සහ දේපළ බෙදාහැරීම ආදී කාන්තාවනට අසාධාරණ ලෙස බලපාන සමහර පුද්ගලික නීතිවලට ගරුකිරීමට තවමත් රජය විසින් කටයුතු කරයි. (පස්වන කොටස බලන්න)

වසර පුරාම එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ඔවුන්ගේම අධිකරණ පද්ධතිය තවදුරටත් පවත්වාගෙන ගියේය. එල්.ටී.ටී.ඊ. ය විසින් ද්‍රවිඩ වැසියන් වෙත දන්වා තිබුණේ, රජයේ අධිකරණ පද්ධතිය භාවිතයට ගැනීමෙන් වැළකී එල්.ටී.ටී.ඊ. විකල්ප නීති පද්ධතිය කෙරෙහි විශ්වාසය තබන ලෙසත්ය. විශ්වාසනීය මූලාශ්‍ර වාර්තා මගින් අනාවරණය වූයේ, එල්.ටී.ටී.ඊ.ය සිය බලය මේ සඳහා යොදාගත් බවයි.

එල්.ටී.ටී.ඊ. විනිශ්චයකාරවරුන්ගේ නීති පිළිබඳ දැනුම අල්ප හෝ ශුන්‍ය මට්ටමක පවතී. නීතිමය අධිකාරී බලයක්, නිශ්චිත වූ හෝ සංග්‍රාහකත්වයකින් තොරව එල්.ටී.ටී.ඊ. අධිකරණ ක්‍රියාත්මක වන අතර අධිකරණයේ ස්වාධීන පුද්ගලයෙකු වෙනුවට ක්‍රියාකරනුයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නියෝජිතයන්ය. 2005 සැප්තැම්බර් මස එල්.ටී.ටී.ඊ. අත්අඩංගුවට ගන්නා ලද ජාතික ළමාරක්‍ෂක අධිකාරියේ පොලිස් නිලධාරී තිදෙනාගෙන් තෙවැන්නා අගෝස්තු මස 26 වැනි දින නිදහස් වූවේය. සැකකරුවෙකු සොයා එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශයකට පැමිණි අවස්ථාවේදී ඔවුන් අත්අඩංගුවට පත්ව සිටියහ. පළමුවන පොලිස් නිලධාරියා ජනවාරි 26 වැනි දින නිදහස් කෙරුණු අතර, පෙබරවාරි 18 වැනිදා දෙවැනි පොලිස් නිලධාරියා නිදහස් කෙරුණේ, එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නාවුක භටයන් 4 දෙනෙකු වෙනුවට හුවමාරුවක් ලෙසය.

<u>දේශපාලන සිරකරුවන් හා රැඳවියන්</u>

රජය විසින් දේශපාලන සිරකරුවන් රඳවාගෙන සිටින බවට වාර්තා නොමැත. දේශපාලන සිරකරුවන් ගණනාවක් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් රඳවාගෙන සිටින බවට වාර්තා පළවී ඇත. කෙසේ නමුත්, සංඛ්‍යාත්මකව මෙම තත්ත්වය නිර්ණය කිරීමට අපහසු වී ඇත්තේ, ආයතනයේ රහසිගතභාවය හේතුවෙනි. එසේම ජාත්‍යන්තර රතුකුරුස කමිටුවට (ICRC) එවැනි සිරකරුවන් පිළිබඳ සොයා බැලීමට එල්.ටී.ටී.ඊ.ය විසින් අවසර නොදීම තවත් හේතුවකි.

## f. පුද්ගලිකත්වයට, පවුල් ඒකකයට, නිවාස හා ලේඛනයට එල්ල වන අත්තනෝමතික මැදිහත්වීම්.

පුද්ගලිකත්වය සම්බන්ධ අයිතියට නීතියෙන් ඉඩ ලබාදී ඇති අතර රජය සාමාන්‍යයෙන් එම ඉඩකඩ කෙරෙහි ගරු කිරීමක් කරයි. කෙසේ නමුත්, පුරවැසියන්ගේ පෞද්ගලිකත්ව අයිතිය සමහර ප්‍රදේශවල උල්ලංඝනය වී ඇත. සාමාන්‍ය නීතිය යටතේ සෝදිසි කිරීමට හා අත්අඩංගුවට ගැනීමට පොලිසිය නිසි වරෙන්තු ලබාගැනීම් සිදුකරයි. එහෙත්, උතුරු නැගෙනහිර ප්‍රදේශවල වසර තුළදී ආරක්‍ෂක හමුදාවට එරෙහි නිතර සිදුවූ ක්ලේමෝ බෝම්බ ප්‍රහාර සහ කොළඹ දී ක්ලේමෝ බෝම්බ රැසක් සොයාගැනීම සමග ඒ අවට නිවාසවල සෝදිසි මෙහෙයුම් අඛණ්ඩව සිදුවේ.

සිය ඔත්තුකරු ජාලය පවත්වාගෙන යාමෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පුරවැසියන්ගේ පුද්ගලිකත්වයට නිරතුරුව මැදිහත් වී ඇත.

## g. අභ්‍යන්තර ගැටුම්වලදී සිදුකෙරෙන අනවශ්‍ය බලය යොදාගැනීම හා අනෙකුත් අපයෝජනඃ

සිවිල් ජනතාව ඉලක්ක කර සිදුකළ ප්‍රහාර ආදිය මගින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිය බලය අසීමිතව භාවිත කරයි. 2001 වසරේදී සාම වෑයම ආරම්භ වූ අවස්ථාවේ පටන් එල්.ටි.ටි.ඊ.ය විසින් ඉලක්ක ගත ඝාතන, පැහැරගෙනයාම් සහ ළමුන් බලහත්කාරයෙන් යුද්ධයට බඳවාගැනීම් ආදී ක්‍රියාවන්හි නිරත වේ. 2004 වසරේ සුනාමි ව්‍යසනය සහ රජය සමග ගැටුම් ඇතිවීම හේතුවෙන් අභ්‍යන්තරව අවතැන්වූ සරණාගත පවුල් සඳහා ලබාදෙන ආහාර හා ඉන්ධන ඇතුළු බොහෝ ද්‍රව්‍ය පැහැරගැනීම්වල එල්.ටී.ටී.ඊ.ය නිරත වන බවට නිරන්තර වාර්තා පවතී. ආරක්ෂක හමුදාවල සහ පොලිසියේ සාමාජිකයන් 531 දෙනෙකු එල්.ටී.ටී.ඊ.ය විසින් එම වසර තුළදී ඝාතනය කළ බවට විශ්වාසනීය වාර්තා අනාවරණය කරයි. එසේම එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහි නියෝජිතයන් 34 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් මෙසේ ඝාතනයට ලක්ව ඇත. ඔවුන් අතර එල්.ටී.ටී.ඊ.යට එරෙහි ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (EPDP) හා කරුණා පාර්ශ්වයට හිතැති අතුරු හමුදා සාමාජිකයින් මෙන්ම සිවිල් වැසියන් ද වන අතර, ඔවුන්ට එරෙහිව තිබූ චෝදනාව වූයේ, ආරක්ෂක හමුදාවට තොරතුරු ලබාදීමය. එල්.ටී.ටී.ඊ.යට එරෙහි දෙමළ පක්ෂවල හිටපු හා වත්මන් සාමාජිකයන් ද ඉලක්ක කරමින් එල්.ටි.ටී.ඊ.ය ක්‍රියාකරයි. වසර තුළදී එල්.ටී.ටී.ඊ. විරෝධී ඊ.පී.ඩී.පී. සාමාජිකයින් 59 දෙනෙකු ඝාතනය කෙරිණි. විශ්වාසනීය මූලාශ්‍ර අනාවරණය කරනුයේ, කරුණා පාර්ශ්වයේ සාමාජිකයන් 30 දෙනෙක් ද එල්.ටී.ටී.ඊ.ය ඝාතනය කළ බවයි. ඉලක්ක ගත මෙහෙයුමක් යටතේ ආරක්ෂක හමුදා බුද්ධි අංශයට සම්බන්ධ සාමාජිකයන් 10 දෙනෙකු එල්.ටී.ටී.ඊ.ය විසින් ඝාතනය කළ බවට විශ්වසනීය සාක්ෂි පවතී. අප්‍රේල් සහ ජුනි මාසයේදී සිදුවූ මරාගෙන මැරෙන ප්‍රහාරවලින් හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකාට බරපතල තුවාල සිදුකොට යුද හමුදාවේ තෙවැනි ප්‍රධානී ජෙනරාල් පාරමී කුලතුංග ඝාතනය කෙරිණි. (පළමු වන කොටස 1 a. බලන්න)

අප්‍රේල් 22 වැනි දින කල්‍යානපුර ප්‍රදේශයේ සිංහල ගොවීන් 6 දෙනෙකු ඝාතනය කිරීම පිළිබඳවද එල්.ටී.ටී.ඊ.ය චෝදනා ලැබ සිටි. මැයි 27 වැනි දින ගත්කතුවර නිහාල් ද සිල්වා ඇතුළු සත්දෙනෙකුගේ පිරිසක් විල්පත්තුව ජාතික වනෝද්‍යානයේදී එල්.ටී.ටී.ඊ. පීඩන බෝම්බවලින් මියගියහ. මැයි 29 වැනිදා වාලච්චේනේ, ඔමිනියමන්ඩු ප්‍රදේශයේ සිංහල සිවිල් වැසියන් 12 දෙනෙකු එල්.ටී.ටී.ඊ.ය විසින් ඝාතනය කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑවේදී එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් බස්රථයකට එල්ල කළ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකින් බස් රථයේ ගමන් ගත් 150 කට අධික සිවිල් වැසියන් අතර වූ 67 දෙනෙකු මරුමුවට පත්ව 86 දෙනෙකු තුවාල ලැබූහ. වසර අවසානය වන විටත්, 2005 මැයි මාසයේ දී ඝාතනය කෙරුණු යුද හමුදාවේ බුද්ධි තොරතුරු අනු ඛණ්ඩයේ අණදෙන නිලධාරී මේජර් නිසාම් මුතාලිෆ් හා 2005 අගෝස්තු මාසයේදී  ඝාතනය කෙරුණු විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර්  ඝාතනය සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටි එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් කිසිවෙකු වසර අවසානය වන විටත්, අත්අඩංගුවට ගෙන නොතිබුණි.

වසර මුළුල්ලේම එල්.ටී.ටී.ඊ.ය විසින් හමුදා සහ පොලිස් නිලධාරීන් ඉලක්ක කර ගෙන පුපුරුවන ක්ලේමෝ බෝම්බවලින් සතියකට අවම වශයෙන් හමුදා භටයන් පස්දෙනෙකුවත් ඝාතනය වන බව හමුදා මූලාශ්‍ර චෝදනා කරයි. ජුනි මාසයේදී අනුරාධපුර ප්‍රදේශයට ආසන්නයේදී සිවිල් ජනතාව ගමන් කළ බස් රථයක් ඉලක්ක කරමින් පුපුරුවා හැරීමක් සිදුකර ඇත. මින් සිවිල් වැසියන් 69 දෙනෙකුත් ග්‍රාමාරක්ෂක භටයෙකුත් හමුදා නිලධාරීන් දෙදෙනෙකුත් ද ඝාතනය වූහ. මෙම ඝාතන සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකු මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැත.

එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මඩකලපුව ප්‍රදේශය භාර නියෝජ්‍ය හමුදා අණදෙන නිලධාරී රාමණන් සහ කාලතුවක්කු බලකායේ අධ්‍යක්ෂ අක්බාර් ඇතුළු එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් 16 දෙනෙකු කරුණා පාර්ශ්වයේ අතුරු හමුදා තුවක්කුකරුවන් විසින් ඝාතනය කළ බවට චෝදනා කෙරේ. එසේම කරුණා පාර්ශ්වය මගින් සිය ගණනක් සිවිල් වැසියන් ඝාතනය කළ බවට ද විශ්වාස කෙරේ. මීට පැහැරගැනීම් හා සම්බන්ධ ඝාතන 10 ක්ද අන්තර්ගතය. (2a කොටස

බලන්න) එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට එරෙහි යුද්ධයට කරුණා සහ ඔහුගේ පාර්ශ්වයේ සාමාජිකයන්ට රජයෙන් යුදමය ආධාර හා රැකවරණ ලබාදෙන බවට වාර්තාවේ. රජය, කරුණා හෝ ඔහුගේ සාමාජිකයන් සමග කිසිදු සබඳතාවක් පවතින බවට නැගෙන චෝදනා ප්‍රතික්ෂේප කරයි.

සටන් විරාම ගිවිසුමට අනුව එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ජාත්‍යන්තර මුහුදු තීරය භාවිත කිරීමට කිසිදු බලයක් නොමැත. එල්.ටී.ටී.ඊ. සංවිධානය පවසන්නේ, උතුරු පළාතේ මුලතිව්වලට ඔබ්බෙන් මුහුදු තීරය සිය පාලන අධිපත්‍යයට අයත් බවයි. සටන් විරාම ගිවිසුමේ මුහුදු සීමා එල්.ටී.ටී.ඊ. සංවිධානය සඳහා වෙන්කර නොමැත. දෙසැම්බර් 23 වැනිදා එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් විසින් ජෝර්දාන වෙළෙඳ නෞකාවක් අත්පත් කරගත්හ. දින කිහිපයකට පසු ඔවුන් නිදහස් කිරීමේදී නැවේ කපිතාන්වරයා සඳහන් කළේ, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් තමන් සහ තම නෞකාවේ පිරිස් බලහත්කාරයෙන් රඳවා ගත් බවයි. වසර අවසානය වන විට මෙම නැව මුලතිව්වලට පිටතින් වෙරළ තීරයේ නැංගුරම්ලා තිබිණ.

රටේ උතුරු කොටසෙත් වන්නි, යාපන ප්‍රදේශවලත් බරපතල ගැටලුවක් වී ඇත්තේ බිම්බෝම්බය. මෙම තත්ත්වය එක්තරා මට්ටමකට නැගෙනහිරද පවතී. (5 කොටස බලන්න) අවතැන්වූවන් නැවත පදිංචි කරවීමේ හා නැවත ගොඩනැගීමේ ක්‍රියාවලියේදී මෙම ජීව බිම්බෝම්බ සහ වෙනත් පුපුරණ ද්‍රව්‍ය වෙතින් බරපතල ගැටලු මතුකරයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වාර්තා කළේ, බිම්බෝම්බ හේතුවෙන් සිදුවූ මරණ 16 ක් හා තුවාලවීම් සිදුවීම් 9 ක් වාර්තා වී ඇති බවයි. ඉහළ යන ප්‍රචණ්ඩත්වය හමුවේ උතුරු නැගෙනහිර පළාත්වල බිම්බෝම්බ ඉවත්කිරීමේ මානුෂීය කටයුතු තාවකාලිකව අත්හිටුවනු ලැබ ඇති අතර වසර අගභාගයේදී රාජ්‍ය නොවන සංවිධාන හා ආරක්ෂක හමුදාව විසින් බිම්බෝම්බ ඉවත්කිරීමේ කටයුතු නැවත ආරම්භ කර ඇත.

වසර තුළදී බලහත්කාරයෙන් ළමුන් 451 දෙනෙකු එල්.ටී.ටී.ඊ.ය යුද්ධයට බඳවාගෙන ඇත. (6d කොටස බලන්න) එල්.ටී.ටී.ඊ.ය ළමුන් 80 ක් නිදහස් කළ නමුත් අවම වශයෙන් ඉන් 52 ක් නැවත බඳවාගෙන ඇත. එල්.ටී.ටී.ඊ. කඳවුරුවලින් පලායන සිසුන් අතර වයස අවුරුදු 8 සිට ඉහළට වූ දරුවන් සිටින බව වාර්තා වේ.

## 2 කොටස

### සිවිල් නිදහසට ගරු කිරීම
### සිවිල් නිදහසට අදාළ සහ ඇතුළත්ව දෙවන කොටස

### a. ප්‍රකාශනය හා මාධ්‍ය නිදහස

ප්‍රකාශනය හා මාධ්‍ය නිදහස නීතියෙන් ලබාදී ඇත. සාමාන්‍යයෙන් මේවාට ගරු කිරීමට රජය පෙළඹී සිටියි. පුද්ගලයන්ට රජය විවේචනය කිරීමට සාමන්‍යයෙන් හැකියාවක් ඇති අතර ඒ සඳහා බියක් හෝ ඒ සඳහා ප්‍රතිප්‍රහාර තත්ත්වයක් ඇති නොවේ. මහජන කැළඹීමකට දායක විය හැකි පොතක, සඟරාවක, පුවත්පතක, පෝස්ටරයක, චිත්‍රපටයක, නාට්‍යයක, ගීතයක, ගුවන්විදුලි/රූපවාහිනී වැඩසටහනක මුද්‍රණය, බෙදාහැරීම, පෙන්වීම, රඟදැක්වීම හෝ විකාශනය නැවැත්වීමට 2005 අගෝස්තු හදිසි නීතිය මගින් රජයට ඉඩ සලසා ඇත. නමුත් රජය මගින් පසුගිය වසර තුළ එවැනි ක්‍රියාවක් සිදුනොකළේය.

ජනමාධ්‍යවේදීන් සුරැකීම සඳහා වන කමිටුව (CPJ) කමිටුව නිකුත් කළ වාර්තාවකට අනුව දෙසැම්බර් 6 වැනිදා රජය විසින් ත්‍රස්තවාදය හා සුවිශේෂී ත්‍රස්ත ක්‍රියා තහනම් කිරීම සහ වැලැක්වීම සම්බන්ධ රෙගුලාසි නීති ගත කෙරිණි. මෙම රෙගුලාසි වලින් ත්‍රස්තවාදය පිළිබඳව අර්ථනිරූපන දැක්වීමට ත්‍රස්තවාදී සැකකරුවන් බන්ධනාගත කිරීමට රජයට ඉඩ

සැලසී ඇත. ජනමාධ්‍යවේදීන් සුරැකීම සඳහා වන කමිටුව (CPJ) වාර්තා කළ ආකාරයට මෙම නීතිය යටතේ එක් ජනමාධ්‍යවේදියෙක් රඳවනු ලැබ සිටියි.

රටේ ප්‍රධාන පුවත්පත් ආයතනයක්, ප්‍රධාන රූපවාහිනී මධ්‍යස්ථාන දෙකක් සහ ගුවන් විදුලි මධ්‍යස්ථානයක්, රජයට අයත්ය. පෞද්ගලික අංශයට අයත් පුවත්පත්, සඟරා, ගුවන් විදුලි හා රූපවාහිනි මධ්‍යස්ථාන රැසක් ඇත. රටතුල විදේශීය මාධ්‍ය සේවා ආයතන කිහිපයක් ද ක්‍රියාත්මකවේ. බොහෝ ස්වාධීන මාධ්‍ය ආයතන මගින් රජය සහ එහි ප්‍රතිපත්ති නිදහසේ විවේචනය කර ඇත. රජය විසින් නව මාධ්‍ය ආයතන සඳහා දේශපාලන තහංචි පැනවීමක් සිදුකර නැත.

එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ ආරක්ෂක හමුදා යන දෙපාර්ශවයේ දැඩි පීඩනයට යටත්ව ස්වයං වාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට රටේ නැගෙනහිර පලාතේ ජනමාධ්‍යවේදීන්ට විශේෂයෙන් සිදුව ඇති බවට වාර්තා පල වී ඇත. සැප්තැම්බර් මස ආරක්ෂක අමාත්‍යංශය විසින් නිවේදනය කළේ ජාතික ආරක්ෂාවේ යහපත තකා ආරක්ෂක ප්‍රවෘත්ති සියල්ල අමාත්‍යංශය හරහා පැමිණිය යුතු බවයි.

රජය විසින් ලබාදෙන ආරක්ෂක ප්‍රවෘත්ති හැර හමුදා මෙහෙයුම් සම්බන්ධයෙන් වෙනත් කිසිදු ප්‍රවෘත්තියක් පල නොකරන ලෙස යාපනයේ උදයන්, දෙමල පුවත්පත් ප්‍රකාශකයන්ට හා එහි කාර්ය මණ්ඩලයට ආරක්ෂක හමුදා ආඥාපතිවරයා දැනුම්දුන් බව වාර්තා පළවේ.

ත්‍රිකුණාමලයේදී ජනවාරි දෙවැනිදා ද්‍රවිඩ සිසුන් පස් දෙනෙකු ඝාතනය කිරීමේ ප්‍රවෘත්තිය වාර්තා කිරීම් සමගම ජනවාරි 24 වැනි දින සුබ්‍රමනියම් සුගිතරාජා නැමැති දෙමළ ජනමාධ්‍යවේදියා නාඳුනන තුවක්කුකරුවන් විසින් ඝාතනය කර ඇත. එම මාධ්‍යවේදියා දිනපතා දෙමළ පුවත්පතක් වූ සුඩර්ඔිලි පුවත්පතේ සේවය කළේය. (උදයන් ප්‍රකාශන සමාගමේ සහෝදර පුවත්පතක්.) මියගිය දෙමළ සිසුන් 5 දෙනාගේ හිසේ තිබූ තුවාල පිළිබඳ ඡායාරූප ඔහු විසින් පළකර තිබුණි.

උදයන් පුවත්පත් කාර්යාලයට මැයි දෙවැනිදා තුවක්කුකරුවන් ඇතුල් වී එහි උපකරණ සහ පිරිසට වෙඩි තබා ඇත. සුරේෂ් කුමාර් සහ රංජිත් කුමාර් නැමැති සේවකයින් දෙදෙනෙකු සිද්ධියෙන් මියගිය අතර තවත් සේවකයන් සිව් දෙනෙකු තුවාල ලැබූහ.

මඩකලපුව ප්‍රදේශයේ ස්වාධීන දෙමළ වාර්තාකරුවෙකු වූ අයියාතුරේ නඩේෂන් නාඳුනන ඝාතකයන් විසින් ඝාතනය කළේ මැයි මස 31 වෙනිදාය. මොහු නාඳුනන පුද්ගලයන්ගේ ක්‍රියාකලාප හා මැදිහත්වීම් ඇතුළු සිදුවීම් පිළිබඳ ස්වාධීන දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයට ප්‍රවෘත්ති සැපයූ මාධ්‍යවේදියෙකි.

ස්වාධීන සිංහල පුවත්පතක් වූ සත් දින පුවත්පතේ, ආරක්ෂක වාර්තාකරු සම්පත් ලක්මාල් නැමැති මාධ්‍යවේදියා ජූලි පළමුවැනිදා නාඳුනන තුවක්කුකරුවන් විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී. රජය සහ එල්.ටී.ටී.ඊ. සටන්කාමී කණ්ඩායම් අතර ගැටුම් පිළිබඳව මෙන්ම අපරාධ සම්බන්ධයෙන් ඔහු වාර්තා කිරීම් සිදුකර ඇත.

උදයන් පුවත්පත් කාර්යාලයට අනුයුක්ත රියදුරෙකු වු සදාසිවම් බාස්කරන් අගෝස්තු 15 වැනිදා වෙඩි තබා ඝාතනය කෙරුණේ ඔහු සේවය කළ බෙදා හැරීම් රථය තුළදීය. අගෝස්තු 23 දින යාපනයේ උදයන් පුවත්පත් කාර්යාලයට ගිනිතැබීම පිළිබඳ චෝදනා එල්ල වූයේ රජයේ ආරක්ෂක හමුදාවලටය.

කිලිනොච්චි ප්‍රදේශයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ කොටි හඬ ගුවන් විදුලි විකාශන කුළුණට ඔක්තෝම්බර් 16 වෙනිදා ගුවන් හමුදාව බෝම්බ හෙලා විනාශ කර තිබුණු අතර එම ප්‍රහාරයෙන් සේවකයන් දෙදෙනෙකු තුවාල ලැබූහ.

ඔක්තෝම්බර් 23 වෙනිදා විරකේසරි දෙමළ පුවත්පතේ පිටපත් දහදහසක් මඩකලපුවේදී කරුණා පාර්ශවයේ සාමාජිකයන් විසින් ගිනි තබා විනාශ කර තිබේ.

මුනුසාමි පරමේෂ්වරි නැමැති මව්බිම සතිඅන්ත පුවත්පතේ සේවය කළ ලේඛිකාව, පොලිස් අත්අඩංගුවට පත්වූයේ නොවැම්බර් 24 වෙනිදායි. එල්.ටී.ටී.ඊ. සංවිධානය හා ආරක්ෂක හමුදාව අතර පවත්නා ගැටුම් පිළිබඳ ප්‍රවෘත්ති ආවරණය සිදුකළ බව, කියන මෙම මාධ්‍යවේදිනිය ඒ හේතුවෙන් අත්අඩංගුවට පත්වූ බව ඇගේ සගයන්ගේ විශ්වාසයයි. ඇය ත්‍රස්ත විරෝධි පනත යටතේ රඳවා තබා තිබුණු අතර ඒ පනත මගින් චෝදනාවක් නොමැතිව දීර්ඝ කාලයක් රඳවා තැබීමට බලතල පැවරී ඇත.

වවුනියාව දිස්ත්‍රික්කයේ ටෙලෝ සංවිධානය ක්‍රියාත්මක කළ රූපවාහිනි ප්‍රතිවිකාශන මධ්‍යස්ථානයට සහ එල්.ටී.ටී.ඊ.යට පක්ෂපාතී සුඩර්ඔලි පුවත්පතේ කොළඹ පිහිටි මුද්‍රණ හා දැන්වීම් කාර්යාලයට 2005 වසරේදී වෙන් වෙන්ව එල්ල කෙරුණු ප්‍රහාර සම්බන්ධයෙන් කළ පරීක්ෂණවල කිසිදු ප්‍රගතියක් ඇති වී නොමැත. එසේම 2005 ජුනි සහ සැප්තැම්බර් යන මාසවල මඩකලපුව ප්‍රදේශයේ සිදුවූ ඊලනාදන් නැමැති එල්.ටී.ටී.ඊ. පුවත්පත බෙදා හැරීමේ නියෝජිතයන් දෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණවල ද කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැත. මෙම ප්‍රහාර එල්.ටී.ටී.ඊ. යෙන් වෙන්වූ කරුණා පාර්ශවය විසින් සිදුකරන ලද්දක් බවට චෝදනා ඇති අතර දිනපතා දෙමළ පුවත්පතක් වූ තිනකුරල් පුවත්පතට, එම්.ටී.වී., එම්.බී.සී. විකාශන කුළුණුවලට 2004 දෙසැම්බර් මාසයේදී එල්ල කෙරුණු ප්‍රහාර පිළිබඳව පරීක්ෂණ වලද කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැත.

එල්.ටී.ටී.ඊ.ය විසින් සිය පාලනයට නතු ප්‍රදේශවල මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සම්බන්ධයෙන් දැඩිසීමාවක් පවත්වාගෙන යයි. කොළඹ කේන්ද්‍ර කර ගත් දෙමළ ජනමාධ්‍යවේදීන්ට එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් බලපෑම් එල්ල වන බවට වාර්තා පලවී ඇති අතර එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශයේ සිදුවීම් ආවරණය කිරීමේදී ජනමාධ්‍යවේදීන්, ස්වයං වාරණයක් ක්‍රියාත්මක කිරීමට පෙලඹ සිටිති.

## අන්තර්ජාල නිදහස

අන්තර්ජාල භාවිතයේදී රජයේ පාර්ශවයෙන් සීමාවන් පැනවීමක් නොමැති අතර රජය විසින් අන්තර්ජාල සංවාද හෝ ඇතුළු විද්‍යුත් තැපැල් (ඊමේල්) නිරීක්ෂණය කරන බවක් වාර්තා වී නැත. පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට සාමකාමීව අන්තර්ජාලය ඔස්සේ අදහස් ප්‍රකාශණයට අවස්ථාව ඇති අතර විද්‍යුත් තැපැල භාවිත කිරීමට ඉඩ ලැබී ඇත. උදාහරණයක් වශයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අන්තර්ජාල අඩවිය වන ටැමිල් නෙට්, වෙබ් අඩවිය රටපුරාම විහිදී ඇති අතර එයට පිවිසීමට උපයෝගි කර ගැනීමට බාධාවක් නොමැත. - ද්වේශ සහගත කරුණු දැක්වෙන අන්තර්ජාල අඩවි පවා ක්‍රියාත්මක වන අතර ඔවුන් ආරාධනය කරනුයේ සිංහල ජාතියේ ද්‍රෝහීන්ගේ ඝාතකයන්ටය.

## <u>ශාස්ත්‍රීය නිදහස හා සංස්කෘතික උත්සව</u>

ශාස්ත්‍රීය නිදහස හා සංස්කෘතික අවස්ථා හා කිසිදු සීමාවක් රජයෙන් පැනවී නොමැත.

## b. සාමකාමීව රැස්වීමේ සහ සංගමයේ නිදහස

## රැස්වීමේ නිදහස

රැස්වීමේ නිදහස නීතියෙන් ස්ථාපිතය. මෙම නිදහසට රජය විසින් ගරු කරන අතර එය භාවිතයේදී ද දකින්නට ඇත. කෙසේ නමුත් ඇතැම් සීමාවන් බලපැවැත්වේ. උදාහරණයක් වශයෙන් හදිසි අවස්ථා රෙගුලාසි, 2005 අගෝස්තු මාසයේදී රැස්වීම්, සමිති සහ පැනවීමේදී පෙලපාලි සීමා කිරීමේ බලය එමගින් ජනාධිපතිවරයාට පවරා ඇත.

ජනමත විචාරණයක් සඳහා දින නියමිතව තිබියදී දේශපාලන ස්වභාවයේ රැලි සහ පෙලපාලි පැවැත්වීම නීතියෙන් තහනම්ය. කෙසේ නමුත් විරුද්ධ පක්ෂයේ සහ සුළු ජනකොටස් ඇතුළු පාර්ශවවල පෙලපාලි සඳහා සාමාන්‍යයෙන් අනුමැතිය ලබාදීමට රජය ඉදිරිපත්ව සිටියි.

## සංගමයේ නිදහස

සංගමයේ නිදහස නීතියෙන් ස්ථාපිත වන අතර භාවිතයේදී රජය එයට ගරු කරන තත්ත්වයක් දක්නට ඇත. කෙසේ නමුත් ඇතැම් සීමාවන් බලපැවැත්වේ. ඒවා හදිසි අවස්ථා රෙගුලාසි යටතේ වර්ගීකරණය කර ඇත.

එල්.ටී.ටී.ඊ. සංවිධානය ඔවුන්ගේ පාලන බලයට නතු ප්‍රදේශවල සංගමයේ නිදහස සඳහා ඉඩ ලබා නොදෙති. එවැනි රැලිවලට ජනතාව බලෙන් සහභාගී කරවීමට එල්.ටී.ටී.ඊ.ය විසින් බලහත්කාරකම් සිදුකරන බවට වාර්තා වේ.

## c. ආගමික නිදහස

බුදු දහම සඳහා මුල්තැන නීතියෙන් ලබාදී ඇත. එහෙත් නීතිය විසින් සෙසු ආගමික ලබ්දිකයන්ට ඔවුන්ගේ ආගම්, නිදහසේ ඇදහීමට අවශ්‍ය අයිතිය තහවුරු කර ඇත. රජය විසින් මෙම අයිතියට සාමාන්‍යයෙන් ගරු කරන බව පෙනේ. රාජ්‍ය ආගමක් නොමැත. කෙසේ නමුත් බහුතර පුරවැසියන් බුදු දහම අනුගමනය කරන්නන් වෙති. මේ නිසා සෙසු ආගම්වල නිදහසට මෙය අයහපත් බලපෑමක් ඇතිකරවයි.

විදේශීය පූජකවරුන්ට රටතුල වැඩ කිරීමට ඉඩ ඇත. එහෙත් විදේශීය ආගමික පූජකයන් රටතුලට පැමිණීම සඳහා එක්තරා සීමාවක් පවත්වාගෙන යාමට රජය පියවර ගෙන ඇති අතර එහිදී ඔවුන්ට හිමිවනුයේ තාවකාලික සේවා බලපත්‍රයකි. රජය සමඟ ලියාපදිංචි වී ඇති ආගම් කොටස් සඳහා සාමාන්‍යයෙන් අනුමැතිය සීමාකර ඇත. ක්‍රිස්තියානි කණ්ඩායම්වල ඇදහිම් සහ ඒ සඳහා නිවාස තැනීමේ පහසුකම් සඳහා වන අයිතිය සාමාන්‍යනයෙන් අධිකරණය පිළිගනීයි. 2003 දී ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයකින් රෝමානු කතෝලික කණ්ඩායමක් සහ ඔවුන්ගේ වෛද්‍ය සේවා සායනයකට අදාල වැඩසටහනක් ව්‍යාප්ත කිරීම තහනම් කෙරිනී. ඒ අතරතුරම ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ ඕනෑම ආගමක්, ඇදහීමට වැසියන්ට ඇති අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තහවුරු කරන නමුත් අන්‍යාගමකට හැරවීමේ අයිතියට එමගින් අනුමැතිය පල නොවන බවයි. 2003 අගභාගයේ සිට ක්‍රිස්තියානි දේවස්ථාන සහ ඊට සහභාගීවූ සමූහ කණ්ඩායම් හා අනුගාමිකයන්ට නාඳුනන පුද්ගලයන් පහරදුන් අවස්ථා 250 ක් පමණ වාර්තා පලවේ. බෞද්ධ අන්තවාදීන් විසින් වසර තුලදී ක්‍රිස්තියානි දේවස්ථාන රැසකට තැනින් තැන ප්‍රහාර එල්ල කර තිබූ අතර බලහත්කාරයෙන් ආගම්වලට බඳවා ගැනීම පිළිබඳව චෝදනා කරමින් සහ අන්‍යාගම්වලට පුද්ගලයන් හැරවීමට එරෙහි නීතිය සම්බන්ධයෙන් විවාදාත්මක තත්ත්වයක් පැන නැගීමෙන් යම් ආකාරයට සමාජීය උණුසුම් තත්ත්වයක් හටගෙන තිබුණි.

කොළඹට වයඹ දෙසින් පිහිටි සෝමාවති චෛත්‍යයට සන්නද්ධ පිරිස් වෙඩිතැබීම පිළිබඳ ජූනි මාසයේදී වාර්තාවිය. ලොව පුරා ආගමික ප්‍රවෘත්ති වාර්තාවලට (WRN) අනුව මෙම වෙඩි තැබීම එල්.ටී.ටී.ඊ.ය විසින් ගැටුම් ඇති කිරීමේ අරමුණින් ඇතිකළ බව ආරක්ෂක හමුදා පවසා ඇත.

මන්නාරමේ පිහිටි ක්‍රිස්තියානි දෙවස්ථානයක් වෙත ජුනි මාසයේදී නාවික හමුදාව විසින් අත්බෝම්බ ප්‍රහාර එල්ල කර තිබුනු අතර එම සිද්ධියෙන් පුද්ගලයන් 5 දෙනෙකු මියගොස් බොහෝ දෙනෙක් තුවාල ලැබූහ. මෙම බෝම්බ පිපිරීමට පෙරාතුව දේවස්ථානය තුල අවතැන්වූ දෙමළ ජාතිකයන් 200 ක් පමණ රැඳී සිටි බව සිද්ධියෙන් පසු බිෂොප්තුමා වතිකානුවට ලියන ලද ලිපියක දැක්වේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ඇසෙම්බ්ලි ඔෆ් ගෝඩ් පූජකවරයෙකු වෙත 2005 ජුනි මාසයේදී ගම්වාසීන් ප්‍රහාරයක් එල්ල කලහ. මෙම සිද්ධියෙන් ඔහුගේ සොහොයුරු හා සහාය පූජකවරයෙකු ඇතුළු පිරිසක් රෝහල් ගත කෙරිණ. පොලිසිය පුද්ගලයන් 6 දෙනෙකු ප්‍රහාරයට අදාලව අත්අඩංගුවට ගත් නමුත්, ඔවුන් සියලු දෙනා ඇප මත මුදා හැරුණු අතර වසර අවසානය වනවිටත්, නඩුව විභාග වෙමින් තිබුණි.

1990 පටන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එලවා දමන ලද බොහෝ මුස්ලිම්වරුන් තවමත් අවතැන්ය. වසර තුලදී එල්.ටී.ටී.ඊ.ය විසින් නැගෙනහිර පලාතේ මුස්ලිම්වරුන්ගෙන් කප්පම් ගැනීම් හා ඔවුන්ට තර්ජනය කිරීම්වල අඛණ්ඩව නිරතව සිටියහ. මුස්ලිම් ජාතිකයන්ට එරෙහි එම ප්‍රහාර ආගමික පසුබිමක් මත සිදුවූවක් නොවන බවට පෙනී යයි. එහෙත් එය උතුරු නැගෙනහිර පළාත්වල ස්වාධීන දෙමළ රාජ්‍යයක් පිහිටුවීමට උපකාර නොවන පුද්ගලයින් එම ප්‍රදේශවලින් තුරන් කර දැමීම මුල්කරගෙන සිදුවූවක් බව පැහැදිලිය. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් විටින් විට මුස්ලිම් ප්‍රජාව වෙත සැනසිලිදායක ප්‍රකාශ නිකුත් කලත්, ඒවා බොහෝවිට ප්‍රකාශවලට සීමාවූ තත්ත්වයක පවතින බව බොහෝ මුස්ලිම්වරුන්ගේ මතය වී ඇත.

## සමාජයීය අපයෝජනය හා අසාධාරණකම්

ක්‍රිස්තියානි ප්‍රජාවේ සාමාජිකයන්ට එරෙහිව සමාජීය ප්‍රචණ්ඩත්වය හා අතවර සිදුවූ අවස්ථා වාර්තා වී ඇත. සියයකට අඩු සාමාජික සංඛ්‍යාවක් දරණ යුදෙව් ප්‍රජාවට සිදුවී ඇති හිරිහැර ගැන වාර්තා වී නැත.

සවිස්තරාත්මක විස්තර සඳහා <u>2006 ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ වාර්තාව</u> බලන්න.

## d. රටතුල එහාමෙහා යාම විදේශීය ගමන්, විගමනය හා නැවත රටට පැමිණීම (පදිංචිය සඳහා)

සෑම පුරවැසියෙකු සඳහාම රට තුළ එහා මෙහා යාම, පදිංචිය සඳහා රිසි බිමක් තෝරා ගැනීම ආදියට ඇති නිදහස නීතියෙන් තහවුරු කර ඇත. රජය විසින් සාමාන්‍යයෙන් මෙයට ගරු කරනු ලබයි. කෙසේ නමුත් ද්‍රවිඩයන්ට මෙම නිදහස සීමා වී ඇත. එල්.ටී.ටී.ඊ.ය සමඟ පවත්නා රජයේ යුද්ධය නිසා මෙවැනි සීමාවක් පැනවීමට හා විශේෂයෙන්ම රාත්‍රී කාලයේදී කරන කොළඹට පැමිණීමේ සහ උතුරු නැගෙනහිරට ගමන් කිරීමේදී දැඩි ආරක්ෂක සෝදිසි තත්ත්වයක් ඇති කිරීමට හේතුවී ඇත. උතුරු නැගෙනහිර පලාතේ අධිආරක්ෂිත කලාප හරහා ගමන් කිරීමේදී සහ ධීවර කටයුතුවල යෙදීමේදී ද්‍රවිඩයන් විශේෂ සෝදිසි මෙහෙයුම්වලට මුහුණදිය යුතුව ඇත. ද්‍රවිඩ ජාතිකයන්ට පොලිස් වාර්තා අනවශ්‍ය වුවත් රටතුල සැරිසැරීමේදී නොයෙකුත් පීඩාවලට හා අතවරවලට ලක්වීමට සිදුවේ.

යාපනය අර්ධද්වීපය තුල රජයේ ආරක්ෂක හමුදා සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර හමුදාමය ගැටුම් ආරම්භවීමත් සමඟම අගෝස්තු මස 11 වෙනිදා මහනුවර-යාපනය, ඒ - 9 මාර්ගයෙන් ප්‍රවේශයට ඇති ඉඩ රජය විසින් වසා දැමීය. මෙම මාර්ගය වසා දැමීම හේතුවෙන් සිවිල් වැසියන්ගේ ගමනාගමනයත් කිලිනොච්චියේ පිහිටි එල්.ටී.ටී.ඊ. මූලස්ථානය

සහ එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශයක් වන වන්නි කලාපයට සැපයුම් සිදුකිරීමත් දැඩි ලෙස සීමාවිය. අගෝස්තු මාසයේදී වානිජ ගුවන් යානා ගමන් අත්හිටුවනු ලැබීය. සිවිල් ගුවන් ගමන්වලට හෝ රජය හා ජාත්‍යන්තර රතුකුරුස කමිටුව විසින් මුහුද හරහා ක්‍රියාත්මක කෙරෙන ආහාර ද්‍රව්‍යවල නිරුපද්‍රිත ප්‍රවාහනය එල්.ටී.ටී.ඊ.ය විසින් සහතික නොකෙරේ.

ආරක්ෂක හමුදා කඳවුරු, අධිආරක්ෂක කලාප, හමුදා කඳවුර ආසන්නයේ නිශ්චිත ප්‍රදේශ, කඳවුරු, බැරැක්ක හෝ මුරකපොලු වැනි ප්‍රදේශවලට සිවිල් ජනතාවට ඇතුළුවීම වලක්වමින් රජය ඇතැම් ප්‍රදේශවලට සීමාවන් පනවා තිබුණි. ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව ජුනි මාසය ආරම්භයේ දී වාර්තා කළේ සටන් විරාම ගිවිසුමේ උල්ලංඝනයන් වාර්තා කිරීම සඳහා අදාල අඩවිවලට පිවිසීමට ඔවුන්ට වාරණයක් පනවා ඇති බවයි. හමුදා කඳවුරුවල ආරක්ෂක වැටේ සිට  කිලෝමීටර් 4 ක් දක්වා අරයක් ප්‍රදේශ අධිආරක්ෂක කලාප වශයෙන් ව්‍යාප්ත කෙරුණි. ඇතැම් නිරීක්ෂකයන් චෝදනා කළේ මෙම අති විශාල අධිආරක්ෂිත කලාප හේතුවෙන් දෙමළ ජනතාවට ඔවුන්ගේ කෘෂිකාර්මික ඉඩම් (විශේෂයෙන් යාපනය ප්‍රදේශයේ) වලට පිවිසීම වැලැක්වීම සාධාරණ නොවන බවයි. අගෝස්තු මාසය තුලදී දෙපාර්ශවයේ යුදගැටුම් යලි උත්සන්නවීමත් සමගම අවතැන්වූවන්ගේ සංඛ්‍යාව වූ 109,815 ට අමතරව පුද්ගලයන් 46,716 ක් එම කලාප නිසා අවතැන්ව සිටින බවට රජයේ වාර්තාවලට අනුව දැක්වේ. මෙම පිරිස් වර්ග කිලෝමීටර් 60 ක ප්‍රදේශයක පදිංචිව සිටියහ. 2004 වසරේදී රජය විසින් චාවකච්චේරියේ එක් අඩවියකට පනවා තිබූ තහනම ලිහිල් කළ අතර ගොවීන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ගොවිබිම් කරා යලි පැමිණීමට අවස්ථාව සලසා දෙනු ලැබිණි. කෙසේ නමුත් සෙසු ප්‍රදේශවල පිහිටි අධිආරක්ෂිත කලාප ප්‍රදේශවලට සාමාන්‍ය ජනතාවට ඇතුළුවීම තවදුරටත් තහනම්ව පවතියි. ඊට අමතරව යාපනයෙන් බැහැරවන අවස්ථාවකදී එහි පුරවැසියන්ට හමුදාවේ සිවිල් කටයුතු පිළිබඳ ඒකකයෙන් ඒ සඳහා අනුමැතියක් ලබාගැනීමේ අවශ්‍යතාවක්ද පැණවිණ. මූලාශ්‍ර කිහිපයක වාර්තාවලට අනුව මේ සඳහා මාස 5 ක පමණ කාලයක සිට ඉල්ලුම් කළ යුතුව තිබුණි. යාපනයේ වැසියන්ට එහා මෙහා යාමට තවත් තහනමක් පනවමින් පෙරවරු 8 සිට පස්වරු 8 දක්වා හමුදාව විසින් ඇඳිරිනීතියක් ද පැනවූයේය.

## අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන්

සරණාගතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ (UNHCR) වාර්තාවලට අනුව මැයි මාසය වන විට අවම වශයෙන් අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් 418,000 පිරිසක් ඔවුන්ගේ මුල් ප්‍රදේශවල පදිංචියට පැමිණියහ. ගැටුම් හේතුවෙන් එම ප්‍රදේශවල ඉතිරිවූ අවතැන්වූ පිරිස අවම වශයෙන් 312,000 කි. වාර්ගික ගැටුම් හේතුවෙන් අවතැන්වූ පුද්ගලයන්ට රැඳී සිටීම සඳහා කඳවුරු 268 ක් පැවතුණි. වසර තුලදී අවම වශයෙන් පුද්ගලයන් 67,000 ක් සුභ සාධන මධ්‍යස්ථානවල සිටි අතර තවත් 2,46,000 ක් පමණ දෙනා ලැගුම්ගෙන සිටියේ ඔවුනොවුන්ගේ ඥාති හිතවතුන්ගේ නිවෙස්වලයි. විවිධ පාර්ශව මූලාශ්‍රවලට අනුව අවම වශයෙන් අභ්‍යන්තරව අවතැන්වූ පනස් දහසක් පමණ අයට අධිආරක්ෂක කලාප නැවත ස්ථාපිත කිරීම හේතුවෙන් එම ප්‍රදේශවල පදිංචිවීමට හැකියාවක් නොමැත. මොවුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ද්‍රවිඩ වැසියන්ය. සරණාගතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) විසින් සොයා ගන්නා ලද තොරතුරුවලට අනුව අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ කඳවුරුවල බහුලව දක්නට ලැබුණු පොදු ගැටලුවක් වූයේ ලිංගික අපයෝජනයයි. මෙයට මුහුණ දීමට දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන රැසක්ම ඉදිරිපත්ව සිටියි. සරණාගතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) වාර්තාවලට අනුව වසර තුලදී ඉන්දියාවට පලාගිය ද්‍රවිඩ ජාතිකයන් සංඛ්‍යාව 16,000 කි. එල්.ටී.ටී.ඊ.ය විසින් 1990 වසරේදී ප්‍රදේශයෙන් පිටුවහල් කරන ලද මුස්ලිම්වරුන් 46,000 ක් ජීවත් වූයේ සුභසාධන කඳවුරු හා ඒ අවටය. ඇතැම් මුස්ලිම් අවතැන්වූ පවුල් ආපසු සිය නිවෙස්වලට පැමිණි නමුත් බහුතරය පැමිණියේ නැත. එල්.ටී.ටී.ඊ.යෙන් ඔවුන්ට අනතුරක් නොවෙනු ඇතැයි සහතිකයක් ඔවුහු රජයෙන් බලාපොරොත්තු වූහ.

වන්නි කලාපයෙන් මුරකුටි හරහා පිටවෙන පුද්ගලයින්ට එල්.ටී.ටී.ඊ.ය විසින් විටින් විට බාධා පමුණුවා ඇත. එල්.ටී.ටී.ඊ.ය විසින් ඔවුන්ගේ බල ප්‍රදේශ හරහා ගමන් කරන සිවිල් වැසියන්ගෙන් බදු අය කිරීම නොකඩවා සිදුකරයි.

රජයේ ආරක්ෂක හමුදා සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පවත්නා ගැටුම් අභ්‍යන්තරිකව අවතැන්ව සිටින පුද්ගලයන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වී ඇත. සැප්තැම්බර් මස මුල් භාගයේදී එම පවුල් සඳහා පවත්වා ගෙන ගිය කඳවුරු රජය විසින් වසා දැමිණි. ජල සැපයුම් පවා විසන්ධි කෙරිනි. අභ්‍යන්තරිකව අවතැන්වූ පවුල් මෙසේ කන්තලේ ප්‍රදේශයෙන් මුතූර් දෙසට බලහත්කාරයෙන් පලවා හරිනු ලැබිනි. නොවැම්බර් 8 වන දින මඩකලපුව දිස්ත්‍රික්කයේ කදිරවේලිවල පිහිටි සරණාගත කඳවුරක් මතට ආරක්ෂක හමුදා වලින් කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල විය. ඒ හේතුවෙන් පුද්ගලයන් 47 දෙනෙකු මියගිය අතර 136 දෙනෙකු තුවාල ලැබූහ.

## සරණාගතයින්ගේ ආරක්ෂාව

1951 වසරේ සරණාගතයන්ගේ තත්ත්ව සහ එහි 1967 මුල් කෙටුම්පතට අනුව රැකවරණ හෝ සරණාගත තත්ත්ව පතන්නන් සඳහා නීතියෙන් ඉඩක් නොමැත. සරණාගතයන්ට ආරක්ෂාව සලසාදීම සම්බන්ධයෙන් යාන්ත්‍රණයක් රජය විසින් හඳුන්වාදී නොමැත. කෙසේ නමුත් සරණාගතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) සහ සරණාගතයන්ට සහාය වන අනෙකුත් මානුෂීය ආයතන සමග රජය සහයෝගයෙන් ක්‍රියා කරයි. මුතූර් ප්‍රදේශයේ සිදුකළ හමුදා මෙහෙයුම් හේතුවෙන් අවතැන්වූ සිවිල් වැසියන් 40,000 ක් ජූලි සහ අගෝස්තු මාසවලදී ඔවුන්ගේ ගම්බිම්වල යලි පදිංචි කරවීමට රජය සහායවී ඇත. ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වාර්තා කිසිවක් නැත. තම රටවලදී හිරිහැර වලට ලක්වේ යැයි සිතන පුද්ගලයින් ආපසු ඔවුන්ගේ රටවලට බලයෙන් රජය විසින් යැවූ බවට වාර්තා වී නැත. සරණාගතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) වාර්තා කරන අන්දමට වසර ඇතුලත ඉන්දියාවට පලාගිය පුරවැසියන් පිරිස 16,000 ක ඉක්මවයි.

<u>3 කොටස</u>

## දේශපාලන අයිතියට ගරු කිරීම:

## සිය රජය වෙනස්කර ගැනීමට පුරවැසියන්ට ඇති අයිතිය

නීතියෙන් පුරවැසියන්ට ඔවුන්ගේ රජය වෙනස් කර ගැනීමේ අයිතියක් ඇත. එම අයිතිය පුරවැසියන් විසින් භාවිත කරන්නේ, කලින් කලට පවත්වන බහු පාක්ෂික, නිදහස් හා සාධාරණ මැතිවරණ තුලිනි. කෙසේ නමුත් පසුගිය මැතිවරණ කාලයන්හි කළේ ප්‍රචණ්ඩත්වය සහ යම් අක්‍රමිකතාවයන් දක්නට ලැබිණි.

## මැතිවරණ හා දේශපාලන සහභාගීත්වය

අවුරුදු 6 ක කාලසීමාවක් සඳහා 2005 නොවැම්බර් මාසයේදී ජනාධිපතිවරයා තෝරාපත් විය. ජනාධිපතිවරයාට විධායක බලය සතුය. 2004 අප්‍රේල් මාසයේදී තෝරාපත් කර ගැනුණු පාර්ලිමේන්තු සාමාජිකයින් 225 දෙනා වෙත ව්‍යවස්ථාදායක බලය සතුවේ.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂකයන් පෙන්වා දෙන්නේ 2005 ජනාධිපතිවරණය සාමාන්‍ය සතුටුදායක මට්ටමකින් පැවතුනු බවයි. නමුත් මැතිවරණය වර්ජනය කරන ලෙස එල්.ටී.ටී.ඊ.ය විසින් කරන ලද නියෝග හා උතුරු නැගෙනහිර පළාත්වල තැනින් තැන සිදුවූ බෝම්බ පිපිරවීම් නිසා එම පළාත්වල මැතිවරණ කටයුතු කඩාකප්පල් විය. උතුරු පලාතේ

සියයට එකකටත් අඩු ඡන්ද දායකයින් පිරිසක් ඡන්දය භාවිත කලහ. ඊට පෙර වසරවල සිදුවූවාක් මෙන් මිනීමැරුම් හා බරපතල තුවාල සිදුකිරීම් මැතිවරණ දිනයේදී වාර්තා නොවිය. කෙසේ නමුත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දත්ත නිකුත් කිරීමට පොලිස්පතිවරයා ප්‍රතික්ෂේප කෙළේය. යුරෝපීය සංගමයේ මැතිවරණ නිරීක්ෂකයන් නිගමනය කර තිබුනේ රාජ්‍ය මාධ්‍ය විසින් පක්ෂග්‍රාහීව හැසිරුණු බවත්, මැතිවරණ ව්‍යාපාරවලදී මහජන දේපල අවභාවිතයට ලක් වූ බවත්ය.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කමිටුව දක්වා තිබුනේ 2004 මහ මැතිවරණය ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් පැවැත්වූ බවයි. එහෙත් උතුරු නැගෙනහිර පලාත්වල යම් පුද්ගලයන් වෙනුවට වෙනත් පුද්ගලයන් පෙනී සිටීම හා කිහිප වතාවක් ඡන්දය ප්‍රකාශය කිරීමට ඉදිරිපත්වීම ආදී අක්‍රමිකතාවයන් විශාල වශයෙන් වාර්තා විය. බොහෝ පාර්ශවයන් අවධාරණය කළේ මෙම අක්‍රමිකතා සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය වගකිව යුතු බවයි. යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කමිටුව විසින් 2000 කට අධික මැතිවරණ ප්‍රචණ්ඩ සිදුවීම් සංඛ්‍යාවක් වාර්තා කළේය. මෙයට පුද්ගල ඝාතන 5 ක් හා තවත් පුද්ගලයන් 15 දෙනෙකුට බරපතල තුවාල කිරීමේ සිදුවීම් ද ඇතුළත්ය. එම මැතිවරණයේ ඡන්ද ප්‍රකාශිත ප්‍රතිශතය සියයට 75 කි. පෙර මැතිවරණවලදී මෙන් නොව එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවලින් පැමිණ රජයේ ප්‍රදේශවල පිහිටුවා තිබූ පර්ෂද ඡන්ද මධ්‍යස්ථානවලට පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමට රජය විසින් වැසියන්ට අවසර දුනි.

සාමාජිකයන් 225 දෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 11 කි. කාන්තාවන් තිදෙනෙක් අමාත්‍ය මණ්ඩලයට පත්ව සිටියි. කාන්තාවන් දෙදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවයේ නියුක්තව සිටිති. පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රිවරුන් සංඛ්‍යාව 225 ක් වන අතර ඉන් 24 දෙනෙක් මුස්ලිම් ජාතිකයන් ද, 34 දෙනෙක් ද්‍රවිඩ ජාතිකයන් ද වෙයි. සුළු ජාතීන්ට හා කාන්තාවන්ට දේශපාලන පක්ෂවල අවස්ථා හිමිකරදීමේ නියත ප්‍රතිශතයක් හෝ නියත සංඛ්‍යාවක් පිළිබඳ ඉඩක් නොපෙනේ.

## රජයේ අක්‍රමිකතා සහ පාරදෘශ්‍යභාවය

විධායක සහ ව්‍යවස්ථාදායක ශාඛාවල දූෂණය දක්නට ඇත. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය පවසන්නේ, රජයේ සහ රජයට අයත් ආයතනවලට නිලධාරින් පත් කිරීමේදී ඥාතීන්ට හා හිතමිත්‍රාතීන්ට අයුතු ලෙස සලකන බවය. රජයේ ටෙන්ඩර්, මිලදී ගැනීම් ක්‍රියා පිළිවෙත සහ රජයේ කොන්ත්‍රාත් සම්බන්ධ ක්‍රියා පිළිවෙත් පාරදෘශ්‍ය තත්ත්වයෙන් බොහෝ සෙයින් බැහැරව ඇත. ටෙන්ඩර් නොලැබූවන් නිරතුරු පැවසුයේ එම පිළිවෙත් දූෂණයෙන් පිරී ඇති බවයි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් අවධාරණය කර ඇත්තේ අධික මිල ටෙන්ඩර් ක්‍රියා පටිපාටි හා ව්‍යවස්ථාදායකත්ව මෙහෙයුම් ද දූෂිත බවයි.

අල්ලස් හෝ දූෂන චෝදනා විමර්ශන කොමිසම වෙත පැමිණිලි 3212 ක් ලැබී ඇති අතර ඉන් 943 ක් වසර අවසානය වනවිට විභාග වෙමින් පැවතිණ. එම කොමිසමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට අනුව වසර අවසානය වනවිට නඩු විභාග විණ. හිටපු ආරක්ෂක නියෝජ්‍ය ඇමති රත්වත්තේ විසින් ප්‍රශ්න සහගත ආකාරයට දේපල අත්පත් කර ගැනීම පිළිබඳවද නඩු විභාගයක් විය.

රජයේ තොරතුරු මහජනයා වෙත ලබාදීමට නීතිමය ඉඩකඩ නොමැත.

## <u>4 කොටස</u>

## මානව හිමිකම් කඩ කිරීම් සම්බන්ධ චෝදනාවලට ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන ආයතනවල පරීක්ෂන කෙරෙහි රජයේ ආකල්පය.

රජයේ තහනමක් රහිතව දේශීය හා අන්තර් ජාතික මානව හිමිකම් කණ්ඩායම් විසින් සිය පර්යේෂණ කටයුතු හා ඒවායේ සිය අනාවරණයන් ප්‍රකාශයට පත්කිරීම් දක්නට ලැබිණ. මෙම නිර්දේශ කෙරෙහි රජයේ නිලධාරින්ගේ ප්‍රතිචාරය යහපත්ය. (මානුෂීය සේවායතන සමූහය CHA), මානව හිමිකම් නිවහන මානව හිමිකම් සඳහා යාපනය, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් (UTHR), සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය, (CRM), නීතිය හා සමාජ භාරය (LST) ආදී බොහෝ දේශීය රාජ්‍ය නොවන සංවිධාන විසින් සිවිල් හා දේශපාලන, නිදහස පිළිබඳව අවධානය යොමු කරයි. රාජ්‍ය නොවන සංවිධානවල මුල් ලියාපදිංචියේදී ඒවාට මුදල් ලැබෙන ආකාරය හා ඒවා මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සැලසුම් පිළිබඳ දීර්ඝ විස්තර රජය විසින් ඉල්ලා සිටින අතර සෑම පස්වසරකට වරක් එම විස්තර සැපයීම අවශ්‍යතාවයකි. අගෝස්තු මාසයේදී රජය විසින් රාජ්‍ය නොවන සංවිධානවලට අවධාරණය කර තිබුණේ උතුරු නැගෙනහිර ක්‍රියාත්මක වන සංවිධාන, ආරක්ෂක අමාත්‍යංශය යටතේ ලියාපදිංචි වන ලෙසයි. එහෙත් මෙම අනිවාර්ය නියෝගය සියලු රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ අවශ්‍යතාවයක් ලෙස ක්‍රියාත්මක නොවිනි. සමහර රාජ්‍ය නොවන සංවිධාන විසින් පෙන්වා දෙන්නේ මානව හිමිකම් සංවිධාන මගින් සිදුකරන ලද විවේචන වලින් පසුව ඒවා මත වඩා දැඩි පාලනයක් කිරීම සඳහා රජය විසින් මෙම පියවර ගත් බවයි. කෙසේ නමුත් බොහෝ රාජ්‍ය නොවන සංවිධාන මෙයට අනුකූලව ක්‍රියාකරයි. එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවල ක්‍රියාත්මක වන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය මණ්ඩල සඳහා නිකුත් කළ රැකියා බලපත්‍ර අලුත් කිරීමට රජය විසින් අගෝස්තු මාසයෙන් පසු පියවර ගෙන නැත.

රැඳවුම් පහසුකම් පරීක්ෂා කිරීම සඳහා එම මධ්‍යස්ථානවලට ඇතුල්වීමට ජාත්‍යන්තර රතුකුරුස සමාජයට (ICRC) ලබාදුන් අවසරය රජය තවදුරටත් ක්‍රියාත්මක කරයි. (1c හා 1d කොටස බලන්න.) ජාත්‍යන්තර රතුකුරුස සමාජය විසින් ජාත්‍යන්තර මානුෂීය නීතිය සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවලට පුහුණුවක් ලබාදී ඇති අතර ඊට අවශ්‍ය පාඨමාලා හා පුහුණු උපාංග ද ලබාදී ඇත. වසර තුළදී ජාත්‍යන්තර රතුකුරුස සමාජය (ICRC) විසින් උතුරු නැගෙනහිර එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවල සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ලැබ ඇත. (1g කොටස බලන්න.)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට සිය කටයුතු පවත්වාගෙන යාමේදී පුළුල් බලතල සහ සම්පත් හිමිවේ. සාක්ෂිකරුවන් ලෙස ඔවුන් අධිකරණයකට කැඳවීම සහ ඔවුන්ගේ නිල කාර්ය පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවසර නැත. කෙසේ නමුත්, ඇතැම් මානව හිමිකම් සංවිධානවලට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් එතරම් කාර්යක්ෂම බවක් පෙන්වා නැත. ගොඩගැසී ඇති පැමිණිලි සම්බන්ධ කටයුතු මෙහෙයවීමට ඇති තරම් වූ සම්පත් හෝ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට නැත. රජය විසින් එහි කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සහයෝගයක් නොසැපයීම බරපතල තත්ත්වයකි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විනිශ්චය සභාවක ස්වරූපයෙන් විමර්ශන කටයුතු සඳහා මැදිහත් වනු ලබන අතර යම් මූලික විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂකයෙකුගේ තත්ත්වයෙන් පවත්වාගෙන යාමෙන් වැළකී සිටී.

2004 ජුනි මාසයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම තුළ වධහිංසනය පිටුදැකීම පිළිබඳ නිරීක්ෂණ සඳහා ඒකකයක් ස්ථාපිත කරන ලද අතර එහි කටයුතු "ශූන්‍ය ඉවසීම" වධහිංසන ප්‍රතිපත්තියට අනුයුක්ත කරගෙන තිබේ. මානව හිමිකම් කොමිසම විසින් මෙම ඒකකයට බඳවා ගන්නා ලද නිලධාරීනට අමතර පුහුණුවක් ද ලබාදී වධහිංසන සම්බන්ධ පැමිණිලි ගැන කඩිනම් විභාග කිරීමට පහසුකම් යොදා ඇත. මෙහි තිරසාරභාවය තහවුරු කරනු වස් මානව හිමිකම් කොමිසම විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත්තේ, නිරීක්ෂණ ඒකයකට දැරීමට සිදුවන පිරිවැය පියවන ලෙසයි. පෙර වසර වලදී මෙන්ම මානව හිමිකම් කොමිසමට සිය කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකියාවක් නොමැතිවිය.

එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අණ මත ස්වීඩනය, ෆින්ලන්තය සහ ඩෙන්මාර්කය විසින් නිවේදනය කළේ, ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුවෙන් සිය නියෝජිතයන් ඉවත්කර

ගන්නා බවයි. එල්.ටී.ටී.ඊ. සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් වශයෙන් යුරෝපා සංගමය විසින් ලැයිස්තුගත කළ පසු එම රටවල නියෝජිතයන්ට මෙම කමිටුවෙන් ඉවත් වන ලෙස එල්.ටී.ටී.ඊ. ය ඉල්ලා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නිරීක්ෂකයන් 37 දෙනෙකු රටෙන් ඉවත්වූයේ සිවිල් නිරීක්ෂකයින් 30 දෙනෙකු පමණ මෙහි ඉතිරි කරමිනි.

එල්.ටී.ටී.ඊ.ය විසින් මානව හිමිකම් සඳහා උතුරු නැගෙනහිර මහ ලේකම් කාර්යාලයක් (NESOHR) 2004 ජූලි මාසයේදී ස්ථාපිත කෙරිණි. ආරම්භයේ පටන්ම එම කාර්යාලයට (NESOHR) ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සහ ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් පැමිණිලි සිය ගණනක් ලැබී තිබුණි. එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග මෙම ආයතනයේ ඇති සමීප සබඳතාවය නිසා ඇතැම් කණ්ඩායම් මෙම ආයතනයේ විශ්වාසනීයත්වය පිළිබඳ සැක පහළ කළහ.

<u>5 කොටස</u>

## වෙනස් ආකාරයට සැලකීම, සමාජීය අපයෝජන සහ පුද්ගලයන් අලෙවි කිරීම:

සියලු පුරවැසියන් සඳහා සම අයිතියක් නීතියෙන් සලසා ඇත. භාවිතයේදී මෙම අයිතීන්වලට රජය විසින් කෙරෙන සාමාන්‍ය සැලකීමක් දක්නට ඇත. කෙසේ නමුත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ වාර්ගිකත්වය පදනම් කරගත් අසාධාරණකම් හෝ වෙනස් සැලකීම් සිදුවන අවස්ථා බොහෝය.

කාන්තාවන්

ගෘහස්ත ප්‍රචණ්ඩත්වය නීතියෙන් තහනම් කර තිබුණත්, එම නීතිය තදින් ක්‍රියාත්මක නොවේ. ලිංගික පහරදීම්, ස්ත්‍රී දූෂණ සහ කලත්‍රයන් අපයෝජනයට ලක්කිරීම තවදුරටත් බරපතල ආකාරයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බවට වාර්තා වී ඇත. ලිංගික අපයෝජනය හා සූරාකෑම වෙත නීතිය මගින් විශේෂ අවධානයක් දක්වන්නක් බවට පත්ව ඇත්තේ, ස්ත්‍රී දූෂණ නඩුවලදී අන්තර්ගතය සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ අවශ්‍යතාවය සහ දැඩි දඬුවම් නිසාත්ය. වෛවාහික ස්ත්‍රී දූෂණය බරපතල අපරාධයක් වශයෙන් සලකනුයේ කලත්‍රයන් අධිකරණ තීරණ මත වෙන්ව සිටින අවස්ථාවලදීය. ලිංගික පහරදීම් සිදුවීම්වලදී වින්දිතයන් මුහුණ දෙන අර්බුද නීතිය හමුවේ තරමක් ලිහිල් තත්ත්වයක පවතින අතර අධිකරණය සහ පොලිසියේ පුළුල් දැනුවත් බව මේ සඳහා අවශ්‍ය බව කාන්තා සංවිධාන බොහොමයක මතය වී ඇත. ළමා හා කාන්තා කාර්යාංශය වෙත වසරේ මුල් භාගය තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ පැමිණිලි 876 ක් ලැබී තිබුණි.

මන්නාරම දිස්ත්‍රික්කයේ උලියන්කුලම්හිදී සෙල්වරාජා මහත්මියව දූෂණයට ලක්කිරීමට 2003 වසරේදී දැරූ ප්‍රයත්නය සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් දෙදෙනකුට එරෙහි නඩුව වසර අවසානය වන විටත් විභාග වෙමින් පැවතුණි. මෙම පොලිස් නිලධාරීන් දෙදෙනාට එරෙහිව අධි චෝදනා පත්‍ර ගොනුකිරීමට නීතිපතිවරයා විසින් ඒ වන විටත් පියවර නොගෙන තිබුණු අතර වසර අවසානය වන විටත්, ඔවුන් සුපුරුදු රාජකාරීවල නිරත වූ බව සඳහන් කළ යුතුය.

කාන්තා හා ළමාරක්ෂක කාර්යාංශය පවසන ආකාරයට ස්ත්‍රී දූෂණ සිදුවීම් 481 ක් වාර්තා වී ඇත. එම කාර්යාංශය පෙන්වා දෙන්නේ, එම දූෂණ වලින් 11ක්ම වයස අවුරුදු 18 ට අඩු අය මත සිදුවූ ඒවා බවය. ගෘහස්ත ප්‍රචණ්ඩත්වයට හා ස්ත්‍රී දූෂණවලට භාජනය වන පුද්ගලයන්ට, සහනය සලසන අර්බුද නිරාකරණ මධ්‍යස්ථාන, නීති ආධාර, උපදේශනය වැනි සේවාවන් සීමිත මට්ටමක පවතී.

ගණිකා වෘත්තිය නීතියෙන් තහනම් වුවත් එය වසර පුරාම සිදුවිය. ඇතැම් පොලිස් නිලධාරින් හා ආරක්ෂක අංශ නිලධාරීන් මෙම වෘත්තියේ කොටස්කරුවන් වීම විශේෂත්වයකි. කාන්තා ශ්‍රමය බලහත්කාරයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා කාන්තාවන්ගේ අනවසර සංක්‍රමණයද සැලකිය යුතු මට්ටමක පවතී. (5 කොටස, පුද්ගල සංක්‍රමණය බලන්න)

ලිංගික අතවර නීතිය හමුවේ අපරාධ වශයෙන් සැලකෙන අතර ඒ සඳහා උපරිම වශයෙන් වසර 5 ක සිර දඩුවමක් පැනවිය හැක. එසේ නමුත්, මෙම නීති නිසි ලෙස ක්‍රියාත්මක නොවේ.

රාජ්‍ය සේවයේ රැකියා අවස්ථා සඳහා සම අවස්ථා සැලසීමට නීතියෙන් ඉඩ සලසා ඇත. නමුත් පෞද්ගලික අංශයේ රැකියා සඳහා ස්ත්‍රීන්ට සිදුවන අසාධාරණකම් ගැන පියවර ගැනීමට තරම් නීතිය ප්‍රමාණවත් නැත. ස්ත්‍රීන් බොහෝ විට ලිංගික අතවරවලට භාජනය වන අතර ඔවුනට අධීක්ෂණ ශ්‍රේණි දක්වා උසස් වීම අසීරුය. ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) පර්යේෂණවලට අනුව විධිමත් ශ්‍රම බලකායෙන් හරි අඩක් ස්ත්‍රීන්ගෙන් සමන්විත වුවත් ඔවුනට ලැබෙන රැකියාවල ගුණාත්මක භාවයේ සෑහෙන අඩුවක් දක්නට ඇත. එය එසේ වන්නේ කාන්තා ශ්‍රමය වෙත ඇති ඉල්ලීම් බොහෝ විට ඇත්තේ අඩු වැටුප්, අනියම් තත්ත්ව හා අඩු කුසලතා රැකියා අවස්ථා සඳහා නිසාවේ. විධිමත් හා අවිධිමත් අංශ දෙකේම තත්ත්වය මෙය වේ.

ජාතික සිවිල් හා අපරාධ නීතිය යටතේ කාන්තාවන් සඳහා සම අයිතියක් හිමිව ඇත. කෙසේ නමුත්, දික්කසාදය, ළමා භාරකාරත්වය හා ප්‍රවේණි ධනය ඇතුළු ප්‍රශ්නවලට අදාළව පවුල් නීතිය සම්බන්ධ නඩු විනිශ්චයන් සිදුවනුයේ ඒ ඒ වාර්ගික හා ආගමික කණ්ඩායම්වල සිරිත් හා බැඳි නීතිය යටතේය. කාන්තාවන්ට විවාහ විය හැකි අවම වයස් සීමාව අවුරුදු 18 කි. සිය චාරිත්‍රානුකූල විවාහ වයස අවුරුදු 15 සිට සිදුකරන්නා වූ මුස්ලිම්වරුන් හැර අන් අයට දෙමව්පියන්ගේ එකඟත්වය මත අවුරුදු 18 ට අඩු වයස්වලදී සිදුවන විවාහවලට නීතියෙන් ඉඩ නොමැත. නීතියෙන් කාන්තා උරුමක්කරුවන්ගේ අයිතිය ආයතනගත කර නොමැති බැවින් රජයේ අනුග්‍රහයෙන් සිදුවන පදිංචි කිරීම්වලදී ඉඩම් සඳහා ඇති සම අයිතිය කාන්තාවන්ට අදාළව ප්‍රතික්ෂේප කෙරේ. කාන්තාවන්ට සිදුවන මෙවැනි සැළකීම්, අඩුපාඩු හා, වෙනස් කොට සැලකීම එක් එක් ආගමට හා වාර්ගික සිරිත් හා බැඳි රාමුවට අනුව සිදුවන තත්ත්වයක් පවතී.

## <u>ළමුන්</u>

වයස අවුරුදු 5 ත් 14 ත් අතර ළමුන් පාසල්වලට අධ්‍යාපනය ලබාගැනීමට යායුතු බවට නීතිය සඳහන් කරයි. ළමයින් සඳහා රජයේ කැපවීම පුළුල් වූ රජයේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තුළින් දක්නට ඇත. රජයේ අධ්‍යාපන සහ වෛද්‍ය සේවා සැපයීමේ ක්‍රියාදාමයේදී ළමුන් සඳහා වැඩි නැඹුරුතාවක් පිළිබඳ සම්භාවිතාව රජය ප්‍රදර්ශනය කර ඇත. වයස අවුරුදු 16 ට අඩු ළමුන්ගෙන් සියයට 85 ක් පමණ සංඛ්‍යාවක් පාසල් අධ්‍යාපනය ලබති. විශ්වවිද්‍යාල මට්ටම දක්වා අධ්‍යාපනය නොමිලේ ලබාදේ. ප්‍රතිශක්තීකරණය ඇතුළු සෞඛ්‍ය පහසුකම් ද නොමිලේ සැපයේ.

ළමා ශ්‍රමය සුරාකෑම පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් බොහෝ රාජ්‍ය නොවන සංවිධාන විසින් දරණ මතය නම් ඒ සම්බන්ධව පවත්නා නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම ප්‍රශ්ණයක් බවයි. බොහෝ නීති ක්‍රියාත්මක මූලාශ්‍ර යොමුවී ඇත්තේ, එල්.ටී.ටී.ඊ.ය සමග පවත්නා ගැටුම් පිළිබඳවය. කෙසේ නමුත්, පොලිස් දෙපාර්තමේන්තුවේ ළමා හා කාන්තා කාර්යාංශ ඒකකය විසින් ළමුන්ට සහ කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනු ලබයි.

නීති පද්ධතියේ සඳහන් පරිදි ළමයින් මත සිදුකෙරෙන සියලු ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා, ළමුන්ගේ නීතිවිරෝධී සංක්‍රමණ ක්‍රියාකාරකම් හා ඔවුන් වෙත පාන්නාවූ කෲරකම් ආදී සියල්ල ළමා අපයෝජනයට යටත් වේ. අනිවාර්ය අධ්‍යාපන නීතිවලට පටහැනි වන්නා වූ ළමා ශ්‍රමය සූරාකන ඕනෑම නීතිවිරෝධී ක්‍රියාවක් තහනම් කර ඇත. තවද යුද්ධයේ ළමුන්ගේ සහභාගීත්වයද ඇතුල්වන පරිදි ළමා අපයෝජනයේ නිර්වචනය පුළුල් කර ඇත. ජාතික ළමාරක්ෂක අධිකාරියට අධ්‍යාපන, වෛද්‍ය, පොලිස් හා නීති අංශවලින් නියෝජනයක් ඇති අතර අධිකාරිය කෙළින්ම ජනාධිපතිගේ අධීක්ෂණය යටතේ පවතී. වසර තුළදී ළමාරක්ෂක හා කාන්තා කාර්යාංශය වෙත ළමුන්ට එරෙහිවූ ප්‍රචණ්ඩක්‍රියා සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 1278 කි.

දරුවන්ට ලිංගික අතවර කරන්නන් වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගයක අවශ්‍යතාවය ගැන රජය විසින් දැඩි උනන්දුවක් දක්වා ඇත. අවුරුදු 5-20 ක බරපතල වැඩ සහිත සිර දඬුවමක් සමග අනිශ්චිත දඩමුදල් ළමා අපයෝජකයන් වෙත නියම වේ. වසර තුළදී මීට අදාළව රජය ලිපිගොනු 1692 ක් ආරම්භ කළ අතර ළමයින් මත සිදුකළ කාමාපරාධ (ව්‍යවස්ථාපිත දූෂණ ඇතුලත්ව) සම්බන්ධයෙන් පුද්ගලයන් 700 කට එරෙහිව අධි චෝදනා පත්‍ර රජයෙන් අධිකරණවලට නිකුත්කර ඇත. ඉන් 134 දෙනෙකු නිදහස් වී ඇත. 992 කට අදාළ නඩු විභාග අවසන් වී ඇත. ලිපිගොනු 158 කට අදාළව සිදුකරන පරීක්ෂණ වසර අවසානය වන විට නිම වී නොතිබිණ.

2004 සුනාමි ව්‍යසනයෙන් පසු ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් අනාථ සහ අවතැන්වූ ළමුන් කාමාපරාධකාරයින්ගෙන් ආරක්ෂාකර ගැනීම සඳහා සාර්ථක දැනුවත්කරවීමේ ව්‍යාපාරයක් දියත් කළේය.

මුහුදුකරය ආශ්‍රිතව ඇති සංචාරක නිකේතන ප්‍රදේශවල සිදුවන ළමා ගණිකා වෘත්තිය බැරෑරුම් ප්‍රශ්නයකි. රට තුළ ළමා ගණිකා වෘත්තියේ නියැලෙන්නන්ගේ සංඛ්‍යාව 2000 කට අධික බව රජය විසින් ගණන් බලා ඇත. එහෙත්, පුද්ගලික පාර්ශ්ව විසින් පෙන්වා දෙන්නේ, එම සංඛ්‍යාව 6000 ඉක්මවන බවයි. ළමා ගණිකා වෘත්තියට සබැඳි පුරවැසියන් විසින් බොහෝ විට ළමයින් මත කෙරෙන ලිංගික අපයෝජනය යනු එම ළමයින් ගණිකාවන් ලෙස භාවිතා කිරීමය. ඇතැම් විට ළමා ගණිකාවන් සඳහා විදේශීය සංචාරකයන් ඉලක්ක ගතකරනුයේ පිරිමි ළමුන්ය. මේ අතුරින් ඇතැම් ළමුන් ගණිකා වෘත්තිය සඳහා බලහත්කාරයෙන් යොදාගැනීම ද සිදුවෙයි. (ළමුන් විකිණීම 5 කොටස බලන්න) ළමා අපයෝජනවලට හා ලිංගික සූරාකෑම්වලට ලක්වූවන්ට රැකවරණය සපයන දේශීය රාජ්‍ය නොවන ආයතන සමග එක්වී කටයුතු කරන ළමාරක්ෂක හා පරිවාස දෙපාර්තමේන්තුව ඔවුනට ආරක්ෂාව සපයයි. මේ අතර, සංචාරක කාර්යාංශය විසින් සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත කලාපයේ ජීවත්වන, එම උවදුරට භාජනය විය හැකි ළමුන් වෙනුවෙන් විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරන ලදී.

යුද මෙහෙයුම්වලත් යුදබිමේත් සහය කටයුතු සඳහා බලහත්කාරයෙන් ළමුන් යොදවා ගැනීම හා යුද්ධය සඳහා ළමා සොල්දාදුවන් බඳවා ගැනීමද එල්.ටී.ටී.ඊ.ය විසින් කරනු ලැබේ. ඇතැම් ළමුන් එල්.ටී.ටී.ඊ. කඳවුරුවලින් පැනවිත් ආරක්ෂක හමුදා වෙත හෝ ශ්‍රී ලංකා සටන් විරාම කමිටුව (SLMM) වෙත භාර වී ඇත. මොවුන්ගෙන් සමහරු වයස අවුරුදු 8 දරුවන්ය. එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ කරුණා පාර්ශ්වය විසින් බඳවා ගනු ලබන ළමා සොල්දාදුවන් සංඛ්‍යාව (විශේෂයෙන්ම නැගෙනහිර පළාත තුළ) පෙබරවාරි මස සිට ඉහළ ගොස් ඇති බව විශ්වාසදායක ආරංචි මාර්ග විසින් දක්වා ඇත. (1g කොටස බලන්න) එල්.ටී.ටී.ඊ.ය විසින් ළමුන් බලහත්කාරයෙන් යුද්ධයට බඳවා ගැනීම සම්බන්ධයෙන් 450 කට අධික පැමිණිලි ලැබී ඇති බව විශ්වාසනීය

ආරංචි මාර්ග පෙන්වා දෙයි. කරුණා පාර්ශ්වය විසින් බලහත්කාරයෙන් බඳවාගෙන ඇති ළමා සොල්දාදුවන් සංඛ්‍යාව 200 ක් බවට ගණන් බලා ඇත. මෙම මූලාශ්‍ර තවදුරටත් වාර්තා කර ඇත්තේ, දහසකට අධික ළමා සොල්දාදුවන් පිරිසක් වසර අවසානය වන විට එල්.ටී.ටී.ඊ. භාරකාරත්වයේ පසුවන බවයි. ළමා සොල්දාදුවන් ඉන් බැහැර කරවීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ.ය හා යුනිසෙෆ් සංවිධානය අතර 2003 වසරේදී ඇතිකරගත් ක්‍රියාකාරී සැලැස්මට එල්.ටී.ටී.ඊ.ය විසින් අඛන්ඩවම බාධා සිදුකරන බවට ආරංචි මාර්ග රැසක් වාර්තා කර තිබුණි. මෙවැනි බඳවා ගැනීම් පහසුකරවීම සඳහා අල්ලස් හෝ බලහත්කාරයෙන් මැදිහත්වීම් එල්.ටී.ටී.ඊ.ය විසින් උපයෝගී කරගනු ලබන බව මූලාශ්‍ර රැසක් වාර්තා කරයි. ඇතැම් එල්.ටී.ටී.ඊ. ඉහළ පෙළේ නිලධාරීන් දක්වන්නේ, ළමා සොල්දාදුවන් ස්වෙච්ඡාවෙන් ඊට බැඳී සිටින බවයි.

## නීතිවිරෝධී පුද්ගල සංක්‍රමණය

නීතිවිරෝධී පුද්ගල සංක්‍රමණය නීතියෙන් තහනම් වේ. මෙසේ කාන්තාවන් සංක්‍රමණය කරවීම අවුරුදු 2 සිට 20 දක්වා බරපතල වැඩ සහිත සිර දඬුවමක් සහ දඩයකට යටත් වන වරදක් ලෙස සඳහන් වේ. හොර ජාවාරම සඳහා ළමුන් අලෙවි කිරීම සඳහාද නීතියෙන් ප්‍රතිපාදිතව ඇත්තේ අවුරුදු 20 ක සිර දඬුවමක් හා දඩයකි. කෙසේ වුවද, ළමුන් හා කාන්තාවන් ලිංගික සූරාකෑම් සහ බලයට යටත් කළ ශ්‍රමය ලබාගැනීම සඳහා රට තුළින් හා රට තුළට සංක්‍රමණය කරන ලදී. වාණිජ මට්ටමේ ලිංගික සූරාකෑම් සහ ස්වෙච්ඡා නොවන විවිධ සේවයන් සඳහා ඇතැම් කාන්තාවන් විකිණීම් සිදුවන්නේ, ලෙබනන්, සෞදි අරාබිය, කුවේටය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සහ කටාර් ආදී රටවල රැකියා අවස්ථා දෙන බවට ඇති නීති රාමුව ඔස්සේය. එපමණක් නොව වාණිජ මට්ටමේ ලිංගික සූරාකෑම් සඳහා රට තුළට තායි, චීන සහ ඉතියෝපියානු කාන්තාවන් සුළු වශයෙන් ගෙන්වා ඇත. කාන්තාවන් සහ ළමුන්ගේ නීතිවිරෝධී සංක්‍රමණය රට තුළ සිදුවනුයේ ගෘහස්ථ සහ ලිංගික සේවා අවශ්‍යතාවන් වෙනුවෙනි. ලිංගික සංචාරකයන්ගේ ග්‍රහණයට අසුවන්නේ පිරිමි සහ ගැහැණු ළමුන්ය. ළමා සොල්දාදුවන් ලෙස බඳවා ගැනීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පාලනය කරනු ලබන ප්‍රදේශවලටද ළමුන් සංක්‍රමණය කර ඇත.

රට තුළ පිරිමි ළමුන් ජාවාරමද විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල තවමත් ප්‍රශ්නයක්ව පවතී. සෑම තැනම පරිසරය හා ළමුන් සුරැකීම (PECE) නැමැති දේශීය රාජ්‍ය නොවන සංවිධානයේ වාර්තාවලට අනුව වයස අවුරුදු 8 සිට 15 වයස් සීමාවල පසුවන පිරිමි ළමුන් 6000 ක් පමණ වෙරළාශ්‍රිතව හා කඳු ආශ්‍රිතව ඇති නිකේතනවලදී ලිංගික සූරාකෑම්වල යොදාගන්නා බවට සැලවේ. සංවිධානාත්මක අපරාධකරුවන් හෝ ඇතැම් ළමුන්ගේ දෙමාපියන් විසින් වාණිජ මට්ටමේ ලිංගික සූරාකෑම් සඳහා මෙම ළමුන් බලහත්කාරයෙන් යොදවාගන්නා බවටද ඇතැම් වාර්තා පවතී.

ශ්‍රම සූරාකෑම සඳහා ළමුන්ගේ සංක්‍රමණයට එරෙහිව පුළුල් ජාතික සැලැස්මක් ජාතික ළමාරක්ෂක අධිකාරිය ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආධාර ඇතිව සකස් කර ඇත. ළමුන් සම්බන්ධ අයථා ජාවාරම් සම්බන්ධයෙන් ජාතික ළමාරක්ෂක අධිකාරිය සහ පොලිසිය ද එක්වී කටයුතු කරයි.

මෙම ජාවාරම්කරුවන් පිළිබඳව කාන්තාවන් දැනුවත් කරන විවිධ වැඩසටහන් මෙන්ම, උවදුරට භාජනය වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඳවුරුද රජය මගින් ස්ථාපිත කර ඇත. ලිංගික සංචාරකයන් හා ජාවාරම්වල නිරතවන්නන් හඳුනාගැනීම සඳහා පරිගණකගත වැඩසටහන් ආගමන දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කර නිරීක්ෂණය කිරීමට රජය පියවර ගෙන ඇත.

සැකකටයුතු අන්තර්ජාල සංවාද කුටි නිරීක්ෂණය කිරීම සඳහා වන අන්තර්ජාල නිරීක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකව පවතී.

## ආබාධ සහිත පුද්ගලයන්

ආබාධිත තත්ත්වය මුල්කරගෙන පුද්ගලයෙකු කොන්කිරීම නීතියෙන් තහනම් කර ඇත. කෙසේ නමුත් රැකියාවලදී, අධ්‍යාපනයේදී සහ රාජ්‍ය අංශයේ විවිධ සේවාවන් ලබාගැනීමේදී ආබාධිතයන්ට එරෙහිව සිදුවන අසාධාරණකම් රැසක් පිළිබඳව වාර්තා වී ඇත. ආබාධිත පුද්ගලයින් වෙත ගොඩනැඟිලිවල ලබාදිය යුතු පහසුකම් පිළිබඳ නීති නොමැත. මානසික හා ශාරීරික ආබාධවලට ලක්වූ පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු පාසල් 8 ක් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන අතර එමගින් වෘත්තීය පුහුණුව හා පුහුණුව ලද්දන්ට රැකියා ලබාදීම සිදුකරනු ලබයි. ආබාධ සහිත පුද්ගලයන්ට සහන සැලසීම සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවලට මූල්‍යාධාර ලබාදීමට රජය ඉදිරිපත්ව ඇත. ශරීරාබාධ ප්‍රකෘති කරවන උපාංග සඳහා සහනාධාර, ආබාධිතයන්ගේ විවිධ නිෂ්පාදන මිලදී ගැනීම සහ ආබාධිත පුද්ගලයින් සඳහා රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක පාසල් 74 ක ලියාපදිංචිය යන ඒවාත් රජය මගින් සිදුකරන සේවාවන්ය. සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් දෙලක්ෂයක් පමණ රැකියාලාභී ආබාධිත වූවන් රැකියාවලට බඳවා ගැනීම් කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් තෝරාගෙන ඇත. නමුත් සමාජයේ පැවසෙන ඍණ ආකල්ප සහ සමාජයීය කොන්කිරීම් නිසා ආබාධිත පුද්ගලයින් ගතකරන්නේ අසීරු ජීවිතයකි.

## ජාතික, වාර්ගික හා ජනවාර්ගික සුළුතර කොටස්

සාමාන්‍ය ව්‍යවහාරයේදී වතු දෙමළ හෝ ඉන්දියානු දෙමළ යැයි නම්කරන ඉන්දියානු සම්භවයක් ඇති ද්‍රවිඩ ජාතීන් දසලක්ෂයකට අධික පිරිසක් විහිදී සිටිති. 19 වන ශතවර්ෂයේදී රටට අවශ්‍ය වැවිලි කර්මාන්තයේ යෙදවීම සඳහා ඉන්දියාවෙන් මොවුන්ගේ මුතුන් මිත්තන් ගෙන්වන ලදී. පසුගිය වකවානුවේදී මොවුන් තුන්ලක්ෂයට ආසන්න පිරිසක් පුරවැසිකම සඳහා සුදුසුකම් ලබා නොසිටියහ. අධ්‍යාපනය සඳහා රජයේ මුදල් ප්‍රතිපාදන නොතිබීම මොවුනට සිදුවූ තවත් අසාධාරණයක් විය. 2003 වසරේදී මෙම පිරිසට පුරවැසිකම් ලබාදීම සඳහා පණතක් පාර්ලිමේන්තුවේදී සම්මත වූ අතර, එමගින් තේ වතුකරයේ ද්‍රවිඩ ජාතිකයන් හාරලක්ෂ හැටදහසකට අධික පිරිසකට සම්පූර්ණ පුරවැසිකම පිරිනැමිණ. 2004 අගෝස්තු මාසයේදී සරණාගතයින් පිළිබඳ වූ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය විසින් නව පුරවැසි පණත් සම්බන්ධයෙන් ද්‍රවිඩ ජාතිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කර තිබුණු අතර, එම නිසා 2005 වසර අවසානය වන විට පුද්ගලයන් දෙලක්ෂ හැත්තෑහය දහසක් පුරවැසියන් වශයෙන් ලියාපදිංචි වී සිටියහ. වසර තුළ තවත් පුද්ගලයන් 75,000 ක් ලියාපදිංචි වූ බව සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය තහවුරු කළේය. වසර අවසානය වන විට එක්ලක්ෂ දාහත්දහසක් දෙනෙකුගේ ලියාපදිංචිය තහවුරු නොවී තිබුණි.

විශ්ව විද්‍යාල අධ්‍යාපනයේදී, රජයේ රැකියා ලබාගැනීමේදී සහ රජය විසින් පාලනය කරනු ලබන සෙසු කටයුතුවලදී දීර්ඝ කාලයක් තිස්සේ මෙම දේශීය සහ වතු ද්‍රවිඩ ජාතිකයන් විවිධ අසාධාරණකම්වලට පාත්‍රවූ බව පැවසේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට අනුව නිවාස සම්බන්ධයෙන්ද මෙම ද්‍රවිඩ ජාතිකයන්ට අසාධාරණකම් සිදුව ඇත.

## ආදිවාසී පුද්ගලයන්

රටේ ආදිවාසී පුද්ගලයන් වැද්දන් වශයෙන් හඳුන්වනු ලැබේ. එම සංඛ්‍යාව දහසකට අඩුය. ඇතමුන් ඔවුන්ගේ සාම්ප්‍රදායික චාරිත්‍ර පිළිවෙත් අනුව ජීවිතය පවත්වාගෙන යාමට හුරු පුරුදු වී සිටින අතර ඒ සඳහා නීතියෙන් ද ආරක්ෂණය ලැබී ඇත. ජාතියේ ආර්ථික හෝ දේශපාලන ක්‍රියාවලියන්ට ඔවුන්ගේ සහභාගීත්වය සම්බන්ධයෙන් කිසිදු නීතිමය වැළැක්වීමක්, සීමාකිරීමක් නොමැත. ආරක්ෂිත වනාන්තර ප්‍රදේශවල ඇති ඔවුන්ගේ නිජබිම්වලින් ඔවුන් බැහැර කොට ඇති බවට ඇතැම් ආදිවාසීහු චෝදනා කරති.

## වෙනත් සමාජයීය අපයෝජන හා අසාධාරණකම්

නීතියෙන් පිරිමින් අතර සහ ගැහැණුන් අතර සමලිංගික ක්‍රියාකාරීත්වය අපරාධ වශයෙන් දක්වා ඇතත්, ඊට අදාළව නීතිය ක්‍රියාත්මක වී නොමැත. සමලිංගික සේවනයේ නිරතවන පිරිමින් සහ කතුන්, ද්විලිංගික පුද්ගලයින්, සහ එවැනි අනෙකුත් ක්‍රියාවලට අදාළව ක්‍රියාකරන රාජ්‍ය නොවන සංවිධාන රජයේ ලියාපදිංචි වී නොමැත. ඇතැම් මානව හිමිකම් සංවිධාන පසුගිය වසර කිහිපය තුළදී වාර්තා කළේ, කොළඹ හා අවට ප්‍රදේශවල සමලිංගික පිරිමින් වෙත පොලිසියෙන් අකටයුතුකම්, කප්පම් ඉල්ලීම් හෝ ලිංගික සේවනය අයදීම් සහ පහරදීම් සිදුවන බවය.

එච්.අයි.වී. ඒඩ්ස් ආසාදිත පුද්ගලයන්ට හෝ එච්.අයි.වී. ආසාදන වැළැක්වීමේ වැඩසටහන්වල නියැලී සිටින්නන්ට නිල වශයෙන් සිදුවූ අසාධාරණකම් පිළිබඳව වාර්තා නොවුනි. කෙසේ නමුත් එම කණ්ඩායම්වලට යම් මට්ටමක සමාජයීය අසාධාරණයක් දක්නට ඇත.

6 කොටස

සේවක අයිතීන්

a. සමාගමයේ අයිතිය

වෘත්තීය සමිති පිහිටුවාගැනීම සඳහා සේවකයන්ට ඇති නීතිමය අයිතියට රජය ගරුකරයි. එසේම, රට තුළ දැඩි වෘත්තීය සමිති සම්ප්‍රදායක් දක්නට ඇත. ඕනෑම සේවකයන් 7 දෙනෙකුට වෘත්තීය සමිතියක් ස්ථාපිත කළ හැක. ඒ සඳහා ප්‍රඥප්තියක් ඇතිකිරීම, නායකයන් තෝරා ගැනීම සහ ඔවුන්ගේ මත ප්‍රකාශයට පත්කිරීම සිදුකළ හැක. කෙසේ නමුත් එවැනි අයිතීන් සමාන්‍යයෙන් පරිපාලනමය ප්‍රමාදවලට යටත්වේ. රට පුරා මිලියන 7 ක ශ්‍රම බලකායෙන් අවම වශයෙන් සියයට 20 ක් හා වැවිලි කර්මාන්ත ශ්‍රම බලකායෙන් සියයට 70 ක් සංගම්ගතවී ඇත. එකතුවක් ලෙස ගත් කළ රට තුළ සිටින වෘත්තීය සංගම් සාමාජිකයන් ගණන මිලියනයකි. දළ වශයෙන් පුද්ගලික අංශයේ කෘෂිකාර්මික නොවන ශ්‍රම බලකායෙන් 15%-20% ක් වෘත්තීය සංගම්ගත වී ඇත. පුද්ගලික අංශයේ සේවකයන් විශාල පිරිසක් සිටින ආයතන වෘත්තීය සමිති නියෝජනය කරනු ලබයි. එහෙත්, කුඩා පරිමාණයේ කෘෂිකාර්මික හා කුඩා පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ නිරත පුද්ගලයන් වෘත්තීය සමිති ක්ෂේත්‍රවලට අයත් නොවෙති. රාජ්‍ය අංශයේ සේවකයින් ද විශාල වශයෙන් සංගම් ගත වී ඇත.

ප්‍රධාන පෙළේ වෘත්තීය සමිති රැසක්, දේශපාලන පක්ෂ හා අනුබද්ධ වී ක්‍රියාකරන අතර දේශපාලන ක්‍රියාදාමයේදී වැදගත් භූමිකාවක් ඔවුන්ගෙන් ඉටුවෙයි. නමුත් රාජ්‍ය සේවයේ ප්‍රධාන පෙළේ වෘත්තීය සමිති රැසක් දේශපාලන වශයෙන් ස්වාධීනය. කිසියම් වෘත්තීය සමිතියක් සිය වාර්ෂික වාර්තාව ඉදිරිපත් නොකරන අවස්ථාවේදී එම හේතුව යොදාගනිමින් අදාළ වෘත්තීය සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමට නීතියෙන් ඉඩ සලසා ඇත. මේ අනුව රැකියා සහ කම්කරු අමාත්‍යංශය විසින් එවැනි වෘත්තීය සමිතිවල ලියාපදිංචිය නීතියෙන් අවලංගු කරයි.

විවිධ වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග නිසා සේවයෙන් පහකරන ලද සේවකයන් සම්බන්ධයෙන් ගන්නා නීතිමය ක්‍රියාමාර්ගවලදී සමහර සේවායෝජකයන් අසාධාරණ ලෙස කටයුතු කිරීම ගැන චෝදනා ලබති. එවිට එම සේවකයන් නැවත සේවයේ පිහිටවුවත් ඔවුන්ව වෙනත් ස්ථානවලට මාරුකර යැවිය හැක. වෘත්තීය සමිති විරෝධී හැසිරීම දඩුවම් ලැබිය හැකි වරදක් වන අතර එම දඩුවම ඩොලර් 166 කි. (ශ්‍රී ලංකා මුදලින් රුපියල් 20,000 කි.)

b. සංවිධානය වීමේ සහ සාමූහිකව කේවල් කිරීමේ අයිතිය.

සංවිධානය වීමේ සහ සාමූහිකව කේවල්කිරීමේ අයිතිය නීතියෙන් පිළිගෙන ඇත. කෙසේ නමුත් සමාගම් සුළු සංඛ්‍යාවක් පමණක් එම අයිතියට ගරු කරයි. ලංකා සේවායෝජකයන්ගේ ප්‍රධානතම සංවිධානය වන්නේ ලංකා හාම්පුතුන්ගේ සම්මේලනයයි. (EFC) එය යටතේ පිහිටි සමාගම් 50 ක් ප්‍රධාන පෙළේ සේවායෝජකයන්ගේ සංවිධාන වශයෙන් සාමූහික ගිවිසුම්වලට එළඹ ඇත. සියලු සාමූහික ගිවිසුම් කම්කරු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි වී ඇති සාමූහික ගිවිසුම් සංඛ්‍යාව පිළිබඳ දත්ත ලබාගැනීමට නොහැකිය. ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය (EFC) යටතේ ඇති සමාගම්වලින් අඩකටත් වැඩි සංඛ්‍යාවක් තුළ එනම් 435 ක් තුළ වෘත්තීය සමිති පිහිටා ඇත.

පොලිස් දෙපාර්තමේන්තුව, ආරක්ෂක හමුදාවන්, බන්ධනාගාර සේවය සහ අනෙකුත් අත්‍යාවශ්‍ය සේවාවල යෙදී ඇති සේවකයන් හැර සෙසු සියලු සේවකයන්ට වැඩවර්ජනය කිරීමේ අයිතියක් ඇත. එම අයිතිය නීතියෙන් ස්ථාපිතය. කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ හෝ කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ සිය අයිතීන් සුරක්ෂණය කර දෙන ලෙස පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සේවකයන්ට හැකියාවක් ඇත. ඕනෑම කර්මාන්තයක් අත්‍යාවශ්‍ය සේවාවක් බවට පත්කිරීමේ අයිතිය ජනාධිපති සතුය.

අත්‍යවශ්‍ය නොවන සේවා ක්ෂේත්‍රවල වර්ජකයන්ට එරෙහිව ක්‍රියාකිරීම නීතියෙන් තහනම්ය. කෙසේ නමුත් වර්ජකයන් සේවයෙන් පහකළ අවස්ථා දක්නට ඇත.

අපනයන සැකසුම් කලාපවල (EPZs) සේවකයන්ට සෙසු සේවකයන්ට මෙන් සංගම්වලට බැඳීමේ අයිතිය පවතී. වෘත්තීය සමිතිකරණ අගය රටේ සෙසු කර්මාන්ත සඳහා දළ වශයෙන් සියයට 20 ක් වන නමුත්, එම තත්ත්වය අපනයන සැකසුම් කලාපවල සියයට 10 කටත් අඩු ප්‍රතිශතයක් පෙන්වයි. වෘත්තීය සමිති 10 ක් පමණ අපනයන සැකසුම් කලාපවල ක්‍රියාකාරීව සිටී. වෘත්තීය සමිති සංවිධානය කරන්නන්ට මෙම කලාපවලට ඇතුල්වීමට ඇති අවහිර මීට ප්‍රධාන හේතුවයි. අපනයන සැකසුම් කලාපවල කර්මාන්ත ශාලා 200 ක් පැවතියත්, ඉන් 8 කට පමණ අයත් වෘත්තීය සමිති නිල වශයෙන් හඳුනාගෙන ඇත. ඒ හැර සෙසු කම්හල් කීපයක කලමනාකාරීත්වය විසින් වෘත්තීය සමිති සමග සාකච්ඡා පවත්වනු ලබයි. වසර තුළදී අපනයන සැකසුම් කලාපවල ක්‍රියාත්මක වී ඇත්තේ එකම එක සාමූහික ගිවිසුමකි. කම්කරු නියෝජිතයන් චෝදනා කරනුයේ අපනයන සැකසුම් කලාපවල වේතන සහ සේවකයන්ගේ සේවා තත්ත්වය පාලනය කරන රජයේ ආයෝජන මණ්ඩලය විසින් (BOI) වෘත්තිය සමිති ක්‍රියාකාරීත්වය අඩපණ කරන්නක් බවයි. රැකියාවේ කෙටිකාලීන ස්වභාවය සහ කලාපවල සාමාන්‍යයෙන් දක්නට ඇති තරුණ ශ්‍රම බලකාය අපනයන සැකසුම් කලාපවල සංවිධානය වීමට ඇති බාධාවන් ලෙස පෙනේ.

කම්කරු නියෝජිතයන් චෝදනා කරනුයේ ආයෝජන මණ්ඩලයේ (BOI) බලපෑමට නතුව සිටින කම්කරු කොමසාරිස්වරයා විසින් වෘත්තීය සමිති පිළි ගැනීමට හෝ එම සමිති සමග සහ සාමූහිකව කේවල් කිරීමට විරුද්ධව ක්‍රියාකරන සේවායෝජකයන්ට එරෙහිව නඩු පැවරීමට අපොහොසත්ව සිටින බවයි.

ජාත්‍යන්තර නිදහස් වෘත්තීය සමිති එකමුතුවට අනුව පසුගිය වසර කිහිපය තුළදී අපනයන සැකසුම් කලාපවල වෘත්තීය සමිති අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත. වෘත්තීය සමිති

පිළිගැනීමක් නොතිබීම විවාදාත්මක තත්ත්වයක් නිර්මාණය කරයි. විවිධ බහුපාක්ෂික හා ද්විපාක්ෂික වෙළෙඳ ගිවිසුම් හා ඔවුන්ගේ අවශ්‍යතාවලට අනුව පාර්ශ්ව විසින් ක්‍රියාකිරීම එයට හේතුවයි.

## c. බලහත්කාර හෝ අනිවාර්ය කම්කරු සේවය තහනම් කිරීම

පොරොන්දු පත්‍රවලට යටත්කොට හෝ බලය භාවිතයෙන් කම්කරු සේවයේ යෙදවීම නීතියෙන් තහනම්ය. නමුත්, එවැනි ක්‍රියාදාම භාවිතයේ පවත්නා බවට ඇතැම් වාර්තා අනාවරණ කරයි. ළමා ශ්‍රමය බලහත්කාරයෙන් හා අනිවාර්යයෙන්ම ලබාගැනීම පිළිබඳව වෙනම අර්ථ නිරූපණයක් නීතියේ සඳහන්ව නැතත් රජයේ නිලධාරීන් එම අර්ථ නිරූපණය කරනුයේ සියලු වයස් මට්ටම්වල පුද්ගලයන් සඳහා එය අදාළ වන බවයි. (6d කොටස බලන්න) (දෙමව්පියන්ගේ) ණය හිලව් කිරීම සඳහා ගම් පළාත්වල ළමුන් නගරයේ නිවෙස්වල රැකියාවල යෙදවීම කෙරෙහි විශ්වාසනීය වාර්තා පළවී ඇත. මෙවැනි ළමුන් බොහොමයක් අපයෝජනයට ලක්වී ඇති බවද වාර්තා වේ.

## d. ළමා ශ්‍රමය තහනම් කිරීම හා රැකියා සඳහා අවශ්‍ය වූ අවම වයස් මට්ටම

රැකියා සඳහා වන අවම වයස් මට්ටම අවුරුදු 14 කි. නමුත් දෙමාපියන්ට හා ඔවුන්ගේ භාරකරුවන්ට ඊට වඩා වයසින් බාල ළමයින් කෘෂිකාර්මික කටයුතු හෝ කාර්මික පුහුණුව සඳහා යොදාගැනීමට නීතියෙන් ඉඩ සලසයි. තරුණ හා කාන්තා කටයුතු පිළිබඳ සංශෝධන පනත් කෙටුම්පතට අනුව අවුරුදු 14 ට අඩු ළමුන් කුමන ආකාරයක හෝ රැකියාවක නියුක්ත කරවීම තහනම් කර ඇත. ළමා ක්‍රියාකාරකම් පිළිබඳ 1988 දී කරනු ලැබූ සමීක්ෂණයක් හා 1999 වසරේදී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තාවලට අනුව අවුරුදු 5 සහ 14 වයස් සීමාව තුළ වූ ළමයින් 11,000 ක් පූර්ණ කාලීනව රැකියාවල නියුතු බවයි. තවත් 15,000 ක් නිවෙස්වල සේවයේ හා වෙනත් ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදී සිටිති. මෙම සමීක්ෂණය මගින් අනාවරණය කරගෙන ඇත්තේ, රටපුරා භාරලක්ෂ පනස්දහසක් ළමුන්ව ඔවුන්ගේ පවුල් විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගෙන ඇති බවයි.

ජීවිත හෝ ශාරීරික අවයවවලට අනතුරුදායක තත්ත්වයක් ඇතිකරවන කුමන හෝ රාජ්‍ය ආයතනයක වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින් රැකියාවට බඳවා නොගනී. සැකසුම් කලාපවල, ඇඟලුම් කර්මාන්තයේ හෝ අපනයන කලාපවල වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන් සේවයේ යොදවන බවට වාර්තා නොමැත. කෙසේ නමුත්, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ හා අනෙක් කෘෂිකාර්මික ක්ෂේත්‍රවල අස්වනු නෙලීමේ වකවානුවලදී ඇතැම් විට ළමුන් සේවයට යොදවා ගැනේ. ගෘහස්ථ සේවයේ දහස් සංඛ්‍යාත ළමුන් සේවයේ යෙදවා ඇති බවට මූලාශ්‍ර අනාවරණ කරයි. කෙසේ නමුත් මෙම තත්ත්වය පාලනයකට නතුවී හෝ ලේඛනගතවී හෝ නොමැත. ශාරීරික, ලිංගික හා මානසික අපයෝජනවලට ගෘහස්ථ ළමා ශ්‍රමිකයන් මුහුණ දෙන බවට වාර්තා පවතී. පවුල් ගොවිපලවල්, වැඩපොළවල්, කුඩා පරිමාණ වෙළෙඳ ආයතන, ආපන ශාලා සහ කාර්මික ශාලාවල රැකියා සඳහා ළමයින් යොදාගනිති. 2003 වසරේ දිස්ත්‍රික්ක 5 ක සිදුකරන ලද සමීක්ෂණයකට අනුව නිවෙස්වලින් සියයට දෙකක ගෘහස්ථ සේවකයන් ලෙස වයස අවුරුදු 18 ට අඩු ළමයින් සේවයේ නියුතුව සිටින බවයි. මෙම සමීක්ෂණය ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සහ ළමා ගෘහස්ථ ශ්‍රමය දුරලීමේ ජාත්‍යන්තර වැඩසටහන යටතේ සිදුකරන ලද්දකි. එහෙත්, සැබවින්ම ළමා ගෘහස්ථ සේවකයන්ගේ සංඛ්‍යාව ඊට වඩා ඉහළ අගයක් බව විශ්වාස කෙරේ.

ළමුන් සඳහා ආරක්ෂාව ලබාදීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණය හා නිරීක්ෂණය සිදුකරන මධ්‍යම කේන්ද්‍රය වනුයේ ජාතික ළමාරක්ෂක අධිකාරියයි. කම්කරු දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ පොලිසිය යන ආයතන විසින් ළමා ශ්‍රමිකයන් පිළිබඳ නීති ක්‍රියාත්මක කරයි. ළමා ශ්‍රමිකයින් පිළිබඳ ආරක්ෂක අධිකාරිය වාර්තා කළේ, මේ වසර තුළ ළමා ශ්‍රමිකයින් පිළිබඳ පැමිණිලි 18 ක් ලැබී ඒවා අතුරෙන් එක් සිද්ධියකට අදාළව නඩු පවරා ඇති බවය. බාල වයස්කරුවන් රැකියාවල යොදාගැනීම වෙනුවෙන් දඩය ඉහළ නංවා ඇත. එම දඩ වර්ධනයේ සංඛ්‍යාත්මක අගය දළ වශයෙන් අමෙරිකානු ඩොලර් 9 ක

(රුපියල් දහසක්) සහ හයමසක සිර දඬුවමක සිට හා අමෙරිකානු ඩොලර් 93 එනම් (රුපියල් දසදහසක්) හෝ මාස 12 ක කාලයක් සඳහා වන සිර දඬුවමක් දක්වා වේ.

කම්කරු නීතිය යටතේ පොරොන්දු පත්‍රවලට යටත් කොට හෝ බලය භාවිතයෙන් කුමන වයස් මට්ටමක හෝ පුද්ගලයින් සේවයේ යොදාගැනීම තහනම් කෙරේ. නමුත් බොහෝ ග්‍රාමීය ළමුන් දෙමව්පියන්ගේ ණය හිලව් තුරන් කිරීම සඳහා ළමා ශ්‍රමිකයන් වශයෙන් සේවය කරන බවට වාර්තා පළවෙයි. (5 සහ 6c කොටස් බලන්න.)

යුද්ධය සඳහා වයස අවුරුදු 13 පමණ වූ ළමුන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් යොදවා ගෙන ඇත. වයස අවුරුදු 8 ළමුන් පවා යුද්ධයට බලහත්කාරයෙන් බඳවාගෙන ඇත. (5 කොටස බලන්න.)

යුනිසෙෆ් ආයතනය අනුග්‍රහයෙන් නිකුත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් මගින් අවධාරණය කර ඇත්තේ, මෙම ළමා සොල්දාදුවන් මුදාහරින ලෙස හා ඔවුන් නැවත සමාජයට අනුගත කරන ලෙසයි. මෙම වැඩසටහන යටතේ යුනිසෙෆ් ආයතනයේ අනුග්‍රහයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මුදාහරිනු ලබන ළමා සොල්දාදුවන් සඳහා කඳවුරක් යුනිසෙෆ් අනුග්‍රහයෙන් කිලිනොච්චියේ ආරම්භ කෙරිණි.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 182 වැනි වගන්තියට අනුව රජය විසින් ළමා ශ්‍රමයේ වඩාත්ම අහිතකර ස්වභාවයන් 50 ක් හඳුනාගෙන ඇත. මෙය වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහා වේ. මෙම නිර්නායක වලට අදාළ නීති මෙතෙක් ස්ථාපිත කර නොමැත.

e. පිළිගත හැකි රැකියා තත්ත්ව

ජාතික මට්ටමකින් අවම වැටුප් තලයක් ක්‍රියාත්මක නොවේ. කම්කරු අමාත්‍යංශය යටතේ පඩිපාලක සභා 38 ක් පිහිටුවා ඇත. විවිධ ක්ෂේත්‍ර හා කර්මාන්ත අනුව අවම වැටුප් තල හා සේවාස්ථ ප්‍රමිති මේවාට ඇතුලත් කර ඇත. නමුත් මෙම අවම වැටුප් සේවකයෙකුට සහ ඔහුගේ පවුලට යහපත් දිවි පැවැත්මක් සඳහා ප්‍රමාණවත් නොවේ.

සතියකට පැය 45 කට වැඩි කාලයක් අඛන්ඩව වැඩකිරීම (වැඩකරන සතියකට දින පහමාරක්) පූර්ණකාලීන සේවකයන්ට නීතියෙන් තහනම්ය. අතිකාල සේවා පැය ගණන සතියකට පැය 15 ක උපරිමයකට යටත්වේ. කාර්මික අංශයේ සේවකයන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා බොහෝ නීති හඳුන්වා දී ඇත. එහෙත් කම්කරු අමාත්‍යංශයේ සේවයට අනුයුක්තව සිටින පරීක්ෂකවරුන් සුළු පිරිසකට මෙම නීති ක්‍රියාත්මක කළ නොහැක. සෞඛ්‍ය සහ ආරක්ෂන රෙගුලාසි ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල නොවේ. තමන්ට අනතුරුදායක තත්ත්වවලින් ඉවත්වීමට සේවකයන්ට ව්‍යවස්ථාපිත අයිතියක් පවතී. එහෙත්, බොහෝ සේවකයන් හෝ එවැනි අයිතියක් පිළිබඳව දැනුවත්ව සිටින බවක් නොපෙනේ. එසේම එම අයිතිය වෙනුවෙන් පියවර ගැනීමෙන් සිය රැකියා අවස්ථා අහිමි වේය යන බිය ඔවුන් තුළ පවතින බැවින් වැඩි අවධානයක් ඒ වෙත යොමුනොවේ.